HNB FINANCE

# මෙහෙවර

2021 ඔක්තෝම්බර් කලාපය

## HNB FINANCE වෙතින් කෝවිඩ් පාලනයට ත්‍රීරෝද රථ සඳහා "මගී ආරක්ෂණ ආවරණ"

7 පිටුව

## "HNB FINANCE නිසා අපේ ජීවිත වලට ලැබුණේ විශාල ශක්තියක්...

12 පිටුව

## වයස හැත්තෑහයේදී ජනාධිපති වුණු සරල ඇමරිකානුවා....

2 පිටුව




# HNB FINANCE

## පස්වන වරටත් ලංකාවේ සේවය කිරීමට සුදුසු විශිෂ්ටතම සමාගම් අතරට...!

වැලිමඩ ශාඛාවේ වගතුග සොයා ගිය ගමනක්

5 පිටුව

හැටන් ශාඛාව නව නිවහනකට

16 පිටුව

යෙහෙළියක දුන්නු අමුතු සබන් කෑල්ලක්...

13 පිටුව

ජීවිතයට අරුතක්



# වයස හැත්තෑහයේදී ජනාධිපති වුණු සරල ඇමරිකානුවා....

ඔහු නමින් ජෝ බයිඩන්ය. 1942 උපත ලද ඔහු පවුලේ වැඩිමලා විය. බයිඩන් උපත ලැබුවේ පෙන්සිල්වේනියා ප්‍රදේශයේයි. ඔහුගේ මව ජේන් වූ අතර පියා ජෝෂප් විය. පියා මෝටර් රථ අලෙවිකරුවෙකු විය. මේ නිසාම ඔහුගේ පවුලේ ආදායම නිශ්චිත නොවී අඩුවැඩි විය. එම නිසාම ඔවුන්ට මූල්‍ය දුෂ්කරතා වලට පවා මුහුණ දීමට සිදු විය. බයිඩන්ට ඔහුගේ වගකීම් ද වැඩි විය. ඔහුට පවුලේ දෙමාපියන් සමඟ ගත කිරීමට නොහැකි විය. වැඩිකාලයක් ළමා කාලය ගත කලේ ආච්චි සහ සීයා ළඟය. බයිඩන්ගේ පියා ඔහුට නිතර නිතර පැවසූ වදනක් විය. එනම් ''සූරයා වැටෙන්න වැටෙන්න තරගය අත් නොහැර නැවත නැවත තරගයට පිවිසෙන්න'' යන්නයි.

මොහු පාසල් අවධියේ අතිශය දක්ෂකම් පෑවේ අධ්‍යාපනයට නොව ක්‍රීඩාවටයි. එනම් පාපන්දු සහ බේස්බෝල් ක්‍රීඩාවටයි.

බයිඩන් වයස 23 දී එනම් 1965 නීති විද්‍යාලයෙන් නීති උපාධිය හිමිකර ගන්නා ලදී. එසේම බයිඩන් 1966 දී තම පළමු විවාහය මිලියා හන්ඩර් සමඟ සිදුකරන



අතර එහි ප්‍රතිඵලයක් ලෙස පුතුන් දෙදෙනෙකු සහ දියණියක උපත ලබනවා. වැඩිමහල් පුතු බෝ බයිඩන් වූ අතර දෙවන පුතු රොබට් වූ අතර දියණිය නයෝමි බයිඩන් විය. 1972 වසරේ ඩිමෝක්‍රටික් ඉතිහාසයේ පස්වන ලාබාලතම සෙනෙට් සභිකයා බවට බයිඩන් තරුණයා පත්වෙනවා. නමුත් ඔහුට මේ සතුට විඳීමට හැකිවන්නේ ඉතා සුලු කාලයකි. මක්නිසාද යත් බයිඩන්ගේ ආදරණීය බිරිඳ සිය පුතුන් දෙදෙනා සහ වසර තුනයි මාසයක් වයසැති දියණියද සමඟ නත්තල් සවාරියට යන අතරතුරදී මාරක රිය අනතුරකට ලක් ව තම බිරිඳ සහ කුඩා දියණිය මියයනවා. පුතුන් දෙදෙනා බරපතල තුවාල සහිතව වුවද ජීවිත ගලවා ගන්නවා. එතැන් සිට බයිඩන්ට ඔහුගේ මුලු ජීවිතයම එපා වන තත්වයට පත් වෙනවා. මානසික පීඩනය ඉතා දැඩි මට්ටමකට පත්වෙනවා. විනාඩි කිහිපයක් තුළ දී සතුට දැඩි කම්පනයක් සහිතව දුක බවට පත්වනවා.

අවසානයේ දී මවක්, දියණියක් අහිමිව පුතුන් දෙදෙනකු සමඟ තනිවුනු පියකු බවට ඔහු පත්වෙනවා. කෙසේ හෝ මොහු තම පුතුන් දෙදෙනා දෑතින් වඩාගෙන ජීවිතයට කෙසේ හෝ මුහුණ දෙන අධිෂ්ඨානය ඇතිකර ගන්නවා. ඔහුගේ ජීවිතයට සිදු වූ මෙම අනපේක්ෂිත තත්වය නිසාම විටෙක ඔහුට සියදිවි හානිකර ගැනීමට පවා සිතෙනවා. ජීවිතය ඉදිරියේ ඇතිවන ප්‍රශ්න හමුවේ මිනිසුන් සිතා බලා සැලසුම් කර සිය දිවි හානිකර ගැනීමට තැත්කරන බව පසුව ඔහු විසින්ම පවසා තිබෙනවා.

පුරුද්දක් ලෙස තම පුතුන් දෙදෙනාට රාත්‍රියට නින්ද යනතුරු කතන්දර කියාදීම බයිඩන්ගේ සිරිතක්. දිනපතාම ජෝ බයිඩන් පැය 4 බැගින් පැය 8 ක් දුම්රියෙන් ගමන් කරනවා. මේ ගමන් කරන කාලය ඔහු යොදා ගත්තේ තම පුතුන් දෙදෙනාට රාත්‍රියේදී කියාදෙන කථා පාඩම් කරගැනීමටයි. රැකියාවට යාමට ප්‍රථම පාන්දර අවදි වී දරුවන්ට කෑම සකසා තබා යාම මේ ආදරණීය තාත්තාගේ තවත් පුරුද්දක්.



බයිඩන් වසර 5 කට පසුව එනම් 1977 දී නැවත ගුරුවරියක වූ ජේකොබ් සමඟ විවාහ වෙනවා. ඇය පසුව අධ්‍යාපනඥයෙකු බවට පත්වන අතර ඇය බයිඩන්ගේ ජීවිත කථාව කුඩා දරුවන්ට කියවීමට කුඩා පොතකට ගොනු කරනවා. ඇය ඉතා සුන්දර නිහතමානී කාන්තාවක්. බයිඩන් පසුකලෙක ප්‍රමුඛ පෙලේ නීතිඥයකු ලෙස අධිකරණයේ සභාපති තත්වයටද පත්වෙනවා.කාලයත් සමග ඔහු සිය දක්ෂතා ප්‍රගුණ කරගන්නා අතර ඔහුගේ දෙවන ආගමනය සිදුවන්නේ 1987 වසරේදීයි. බයිඩන් 1987 දී තමා ඇමරිකානු ජනාධිපති සටනට පිවිසෙන බව පළමු වරට ප්‍රසිද්ධයේ පවසනවා. නමුත් ඔහුට එම අවස්ථාව ගිලිහී යනවා. නමුත් බයිඩන් සිය උත්සාහයන් කිසිසේත් අඩු කරන්නේ නැහැ. නැවතත් ඔහු 2007 දී ජනාධිපති සටනට උත්සාහ කරනවා. නමුත් ඔහුට වඩා ජනප්‍රිය බවින් හා සුදුසුකම් වලින් ඉහල බැරැක් ඔබාමා හේතුවෙන් ඔහුගේ එම ජනාධිපති සිහිනය බොඳ වෙනවා. බයිඩන්ගේ ගුණගරුක හා දක්ෂතා හඳුනාගත් ඔබාමා ඔහුව උපජනාධිපති කරන බව දන්වමින්



ජනාධිපති සටනට එක්කර ගත්තා. ඔහු ඔබාමාව ජයග්‍රහණය කරවීමට කැප වන අතර ඔබාමාගේ ධූර කාලයන් දෙකෙහිම උපජනාධිපති වීමට බයිඩන්ට හැකිවනවා සේම එය ඔබාමාට මහත් වූ ශක්තියක්ම වුණා. ඔබාමාගේ අයෝමය ශක්තිය වූයේ බයිඩන්. ඒ නිසාම ඔබාමා බයිඩන්ව හැඳින්වූයේ ඇමරිකාවේ සිටි ''විශිෂ්ඨතම උප ජනාධිපතිවරයා'' ලෙසයි.

03 පිටුවට


**ප්‍රේමසිරි ගමගේ**
සභාපති, ව්‍යාපාර සංවර්ධන කේන්ද්‍රය.

# HNB FINANCE හි නව සභාපතිවරයා ලෙස ඩිල්ෂාන් රොද්‍රිගෝ මහතා පත් කෙරේ



**HNB FINANCE PLC හි නව සභාපතිවරයා ලෙස ඩිල්ෂාන් රොද්‍රිගෝ මහතා 2021 වසරේ සැප්තැම්බර් 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත්කර ඇති අතර ඔහු සමාගමේ ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙස ද අදාළ දින සිට කටයුතු කරනු ඇත.**

හැටන් නැෂනල් බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී ජොනතන් අලස් මහතා 2014 වසරේ සිට 2021 සැප්තැම්බර් දක්වා HNB FINANCE PLC හි සභාපතිවරයා ලෙසින් සමාගමේ උන්නතිය උදෙසා අනභිභවනීය සේවාවක් ඉටුකළ අතර මෙම වසරේ සැප්තැම්බර් 10 වනදා සිට HNB FINANCE PLC හි නව සභාපතිවරයා ලෙස ඩිල්ෂාන් රොද්‍රිගෝ මහතා එම තනතුරේ වගකීම් උසුලනු ඇත.

ඩිල්ෂාන් රොද්‍රිගෝ මහතා බැංකු, රක්ෂණ, ආයෝජන බැංකුකරණය සහ ඇගලුම් ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි උසස් තනතුරු හොබවා ඇත. එමෙන්ම ඔහු දැනට Hatton National Bank PLC හි විධායක අධ්‍යක්ෂ/ප්‍රධාන මෙහෙයුම් නිලධාරී වශයෙන් සේවය කරන අතර HNB Assurance " Guardian Acuity Management " Lanka Financial Services Bureau Ltd සහ Credit Information Bureau ආදී ආයතන වලද ඉහළ තනතුරු දරමින් අනගි සේවයක් ඉටුකරමින් සිටී.

ව්‍යාපාර තිරසර ලෙසින් මෙහෙයවීමේ ප්‍රබල හැකියාවක් සහ ශක්තිමත් නායකත්වයක් සතු ඔහු මේ වනවිටත් HNB බැංකුවේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ කාර්යාවලියට උරදෙමින් ඒ සඳහා ප්‍රමුඛ දායකත්වයක් ලබාදෙන්නෙකි.

ඩිල්ෂාන් රොද්‍රිගෝ මහතා මේ වනවිට ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සහ ආසියානු බැංකුකරුවන්ගේ සංගමයේ (තායිවානයේ) ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ උප සභාපති ලෙස සේවය කර ඇති අතර CIMA, ACCA iy Risk Professional Forum හි සභාපතිවරයා ලෙස දෙවරක්ම වසර දෙකක කාලයක් සේවය කර ඇත. ඔහු දශකයකට වැඩි කාලයක් විවිධ උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලාවන්හි(CIMA, ACCA, PIM MBA) දේශකයෙකු ලෙස තම දැනුම බෙදාදී ඇත. ඔහු දැනට එහි අධ්‍යාපන ක්ෂේත්‍රයන් සඳහා තම දැනුම ලබා දෙන අතරම SLID හි අධ්‍යයන වැඩසටහන් හි ආරාධිත කථිකාචාර්යවරයෙකු ලෙසද කටයුතු කරයි. ඩිල්ෂාන් රද්‍රිගෝ මහතා CIMA සහ ACCA වැනි එක්සත් රාජධානියේ ගිණුම්කරණ ආයතනයන්හි සාමාජිකත්වය දරන අතර එක්සත් රාජධානියේ ක්‍රැන්ෆීල්ඩ් විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධිධාරියෙකි.

මූල්‍ය ක්ෂේත්‍රය තුළ මෙන්ම විවිධ ක්ෂේත්‍රයන් ගණනාවක අත්දැකීම් සහිත නිපුණයකු වූ අප නව සභාපතිතුමන්ට HNB FINANCE සමස්ත කාර්ය මණ්ඩලයේ සුභාශිංශන අප මෙසේ පිරිනමමු. ■

02 පිටුවෙන්

නැවතත් බයිඩන්ට ඉතා දුක්බර සිදුවීමකට 2015 දී මුහුණ දීමට සිදු වෙනවා. එනම් සිය ආදරණීය වැඩිමහල් පුතු බෝ බයිඩන් දරුණු මොලේ පිළිකා රෝගයක් හේතුවෙන් මිය යාමයි. සිය පියාගේ අඩි පාරේ යමින් නීති ක්ෂේත්‍රයට පිවිසි ඔහු ඇමරිකාවේ සලමෙයා ප්‍රාන්තයේ නීතිපතිවරයා ලෙසද කටයුතු කළා. බෝ මිය යන විට වයස 47 ක් . මේ හේතුව නිසාම බයිඩන් 2016 දී ජනපති සටනට පිවිසීම නොකර සිටිනවා. එයට ප්‍රධානතම හේතුව වුයේ තම වැඩිමහල් පුතුගේ අකල් මරණයයි. එසේම ඔහුගේ දෙවන පුතාද ඔහුට කිසිසේත්ම සතුටක් වුයේ නෑ. මක්නිසාද යත් ඔහු දැඩි ලෙස මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ අයෙකු වීමයි. ඔහුගේ වැඩමහල් පුතුගේ ජීවිතය අහිමි වීම ඔහුට කම්පනයක් ඇති වූ අතර නව අරමුණක් ද ඇති කළා. මොහු තම අත්දැකීම් ඉතා ශක්තිමත්ව දරා ගත් අයෙක්. ඔහු එයට එකම එක හේතුවක් දක්වමින් දරා ගැනීමට හේතුව විග්‍රහ කරයි. එනම් ''විශ්වාසය අන්ධකාරයේදී හොඳම දේ දකීය'' යන්නයි. වරෙක බැරැක් ඔබාමා බයිඩන් ගැන මෙසේ පැවසුවා. ජෝ බයිඩන් ගැන දැන ගැනීම යනු රැවටිල්ලෙන් තොරව ආදරය කිරීම ගැනද ආත්මාර්ථයෙන් තොර සේවය කිරීම ගැනද පිරුණු ජීවිතයක් ගත කරන්නේ කෙසේද යන්න පිළිබඳව ජෝ බයිඩන් අපට කියා දෙන බවයි. අවසානයේ සියලු දුක්කම්කටොලු දරා ගනිමින් ඉතා ශක්තිමත් ලෙස 2020 වසරේ ජනපති සටනට ප්‍රවිශ්ට වීමට බයිඩන් තීරණය කරනවා. ඒ වන විට හිතුවක්කාරී ට්‍රම්ප් ඇමරිකානු ජනපතිවරයායි. මෙකල ඇමරිකාව දැඩි ලෙස සාමාජීය වශයෙන් කඩාවැටීමකට ලක් ව තිබුණා. කලු



ජාතිකයෙකු පොලිස් පොලුපහරින් ඝාතනයවීමත් සමඟ ඇමරිකාවේ මෙන්ම ලෝකයෙන්ම ට්‍රම්ප්ව දැඩි එපාවීමකට ලක්වුණා. ඒ මොහු ජනතාව දැඩි ලෙස කුපිත කල අයෙකු වීම නිසයි. නිහඬ හා ශක්තිමත් මිනිසකු වූ බයිඩන්ට මනා හා ශක්තිමත් සටන් බිමක් මේ නිසාම ඇති විය.

එතෙක් මෙතෙක් ඉතිහාසයේ වැඩිම වාර්තාගත ඡන්ද ප්‍රමාණය ලබා ගත් එකම ඇමරිකානු ජනාධිපති මොහු විය. බයිඩන්ට තරමක් හෝ ආසන්න විය හැකි ඡන්ද ප්‍රමාණයක් ලබාගත් පුද්ගලයා වුයේ ඔහුගේම හිතමිතුරු බැරක් ඔබාමා පමණි. ඔහු ලබාගත් ඡන්ද ප්‍රමාණය වුයේ 69498516 කි.මෙම ඡන්ද ප්‍රමාණය අබිබැවූ ජෝ බයිඩන් හිමි කරගත් මුළු ඡන්ද ප්‍රමාණය 81284000 ක්. ඔහු ඇමරිකාවේ වැඩිම ඡන්ද හිමිකරගත් ජනපති විය. මීට අමතරව බයිඩන් තවත් වාර්තා කිහිපයක්ම පිහිටුවා ඇත. එනම්,

වයස්ගතම ජනපතිවීම එනම් වසර 76 දී ජනපති වීම.

වසර 28 කින් පසු බලයේ සිටි ජනපති වරයෙකුට දෙවන අවස්ථාව ලබා නොදී බලයට පත් වීම. ඇමරිකානු පුරවැසියකු ලබන ඉහළම සිවිල් සම්මානය වන Freedom of America සම්මානය දිනාගත් පළමු ජනපතිවීම.

මේ සියල්ල අභිබවා ඔහු රටට ලෝකයට වැදගත් වන්නේ නිරහංකාර, නොපසුබට උත්සාහයෙන් හෙබි සරල දිවියක් ගත කරන සුන්දර මිනිසකු වීමයි. අපත් අප ජීවිතයේ දී සරල හා සුන්දර බව රැකගනිමින් අවශ්‍ය තැනට නිසි නායකත්වයක් ලබා දී සාර්ථකත්වය ලඟා කර ගනිමු. ■

# පහන් තරුව

## නුඹ...

විසල් දෙනෙත් යුග ලඟ ඉඳ මුමුණන
බාල බොළඳ සිත නුඹෙමයි සඳවත
ලෝකය අමතක වී යන මොහොතට
නුඹේ ලගයි මා.....
මගෙ මුළු ලොව නුඹ.....

නුඹෙ හසරැල්ලක ඇති සුකොමල බව
නුඹේ තෙපුල් වල පිරි ලෙංගතු බව
විඳින්න මා සිත පෙරුම් පිරූ බව
නොදන්නවා ඇති නුඹ මා තරමට

නුඹෙ කඳුලැල්ලට කඳුලු උනන බව
නුඹෙ සිත රිදුනම සිත දුක්වන බව
නුඹ නොදකින විට නෙතු විමසන බව
නොදන්නවා ඇති නුඹ මා තරමට

**ධනංජය කලපුගේ**

## දියණියේ නුඹ

කිරි සයුරෙන් සුපිපුණ පුන් සඳ ලෙසට
නුඹ ඇවිදින් සිසිලස දුනි අප ලොවට
මෘදු තෙපුලත් නෙතු කැල්මත් ලබන්නට
පෙර භවයෙන් පිං හිමිවිය මවට

පාමුල පැලය සුරකින ලෙස වනස්පතී
පැටවුන් නිති රකින රජිඳෙකු සේ හස්තී
නුඹ රැක ගනිමි යොදවා ඇති හැම ශක්තී
හා පැටියෙක් වෙතැයි දැඩි බව නොමැත සිතී

සිත ගත සවිව නුවණින් නිතැතින් පිරිපුන්
වෙර වීරිය වඩා එමගින් ජය ලබමින්
පරවී ගියත් හිරු සඳු නුබ කුස තුරුලෙන්
විකසිත වී දිලෙන් කඩුපුල් මලක් ලෙසින්

**-ලලින්ද කුමාර-**
**ප්‍රධාන කාර්යාලය**

## HNB FINANCE පවුලේ අපේම නිර්මාණ ඇතුළත් කවි පොතක්...!

HNB FINANCE සමාගමෙහි කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ සහ ඔවුන්ගේ බිරිඳ හෝ සැමියාගේ නිර්මාණාත්මක කුසලතාවන් රටට හෙළිදරව් කිරීමේ අරමුණ ඇතිව HNB FINANCE PLC හි මානව සම්පත් අංශය මගින් ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාව්‍ය නිර්මාණ එකතුවක් පොතක් ලෙස මුද්‍රණද්වාරයෙන් එළි දැක්වීමට කටයුතු සැලසුම් කරමින් සිටින බව ඔබ මේ වනවිටත් දන්නා කරුණකි.

මේ සඳහා එක් අයකුට කැමති ප්‍රමාණයක් කාව්‍ය නිර්මාණ ඉදිරිපත් කළ හැකි අතර ඉදිරිපත් කරනු ලබන නිර්මාණ ඒ පිළිබඳව ප්‍රවීනත්වයක් උසුලන බාහිර විනිශ්චය මණ්ඩලයකට යොමුකොට ඔවුන්ගේ නිර්දේශ මත සාර්ථක නිර්මාණ පමණක් පොතට ඇතුළත් කිරීම සඳහා තෝරාගනු ලබයි. තෝරාගනු ලබන නිර්මාණ පිළිබඳ අවසන් තීරණය විනිශ්චය මණ්ඩලය සතුය.

**ඔබ විසින් නිර්මාණය කරන ලද සියළුම නිර්මාණ ඔක්තෝම්බර් මස 15 දිනට පෙර HNB FINANCE සමාගමෙහි මානව සම්පත් අංශයේ අනෝමා මල්කාන්ති මහත්මියගේ නමට තැපැල් මගින් යොමු කරන ලෙස දැනුම් දෙමු** එවනු ලබන සෑම නිර්මාණයක්ම අප ඒ පිළිබදව දැනුම් දුන් **HRD/21/10** දැන්වීමෙහි සඳහන් වූ ආකෘතිපත්‍රය සම්පූර්ණ කර කාව්‍ය නිර්මාණය සහිත පිටුවෙහි පිටුපස අළවා එවීමට කටයුතු කරන්න.








# අපි ළඟට එන ගනුදෙනුකරුවාගේ ජීවිත පියවරෙන් පියවර ඉදිරියට යනු දැකීමයි අපේ එකම බලාපොරොත්තුව

## HNB Finance වැලිමඩ ශාඛාව

වැලිමඩ ශාඛාව නව ගොඩනැගිල්ලකට පිවිසුනේ පසුගිය වසරේ නොවැම්බර් දෙවෙනිදාය. සිය පාරිභෝගික ජනතාව වෙත වඩාත් පහසුකම් සපිරි සේවාවක් සැලසීම මෙම නව ගොඩනැගිල්ල වෙත පිවිසීමේ ප්‍රධානතම අභිප්‍රාය විය. නව ගොඩනැගිල්ලට ගෙවදීමෙන් අනතුරුව එක් දවසක අපි වැලිමඩ ශාඛාවට ගොඩවැදුනේ එහි නවතම වගවිත්ති විමසනු රිසියෙනි.

එළවළු වගාවට සහ මල් වගාවට වැඩි ප්‍රසිද්ධියක් උසුලන වැලිමඩ කෘෂිකාර්මික ජීවන රටාවක් හා මුසුවුණු නගරයක් ලෙස හැඳින්වීමේ වරදක් නැත. වැස්ස කඳු හෙල් ආදියෙන් නොතොර වූ ස්වාභාවික පරිසරය ඒ සඳහාම සැදී පැහැදී සිටින්නාක් වැනිය. අනවරත ජීවන අරගලයක නියැලෙන මිනිසුන්ගේ ප්‍රමුඛ මූල්‍ය සහකරුවා ලෙස HNB Finance පිළිවෙත වනුයේ ගනුදෙනුකරුවාගේ තෘප්තිය පමණකි. වැලිමඩ ශාඛාවේ වගවිත්ති ''මෙහෙවර'' ඔස්සේ ඔබට කියන්නට වැලිමඩ ශාඛාවට ගිය අපේ මුඛ්‍ය අරමුණද HNB Finance වැලිමඩ ශාඛාව සිය ගනුදෙනුකරුවන්ට සලසාලනු ලබන සේවාවන් සහ බොහෝ දුෂ්කරතා විඳගනිමින් එම අරමුණ වෙනුවෙන් වෙහෙසෙන වැලිමඩ ශාඛාවේ තරුණ කාර්ය මණ්ඩලයේ වෑයම ඇගයුමට ලක්කිරීමය.

**දහස් සංඛ්‍යාත වූ ගනුදෙනුකරුවන් පිරිසකගේ ජීවිත සමෘද්ධිමත් කරලීමේ කාර්යභාරයට උරදී සිටින HNB Finance සමාගමේ වැලිමඩ ශාඛාවේ එම උදාරතර අරමුණු පිළිබඳව කියන්නට එහි ශාඛා කළමනාකරු වූ ප්‍රදීප් නිශාන්ත පතිරණ මහතා සිය හඬ අවදි කළේ මෙසේය....**

වැලිමඩ කියන්නෙ විවිධ ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් සංකේන්ද්‍රණය වුණු ප්‍රදේශයක් නෙවෙයි. මේ පළාත තුළ කෘෂිකාර්මික බෝග වගාවටත් සාම්ප්‍රදායික ව්‍යාපාර වලටත් හිමිවෙන්නේ විශේෂ තැනක් . විශේෂයෙන් එළවළු වගාව මල් වගාව කුඩා ස්වයංරැකියා ව්‍යාපාර මේ ප්‍රදේශයේ මිනිස්සුන්ගේ ජීවනෝපාය මාර්ග විදිහට ප්‍රචලිත වෙලා තියෙනවා. මේ අයගේ ජීවනෝපාය මාර්ග වැඩිදියුණුකරගෙන පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍යමය ශක්තිය ලබාදීමේ අරමුණ ඇතිව HNB Finance වැලිමඩ ස්ථාපිත කරන්නේ 2003 අවුරුද්දේ ඔක්තෝබර් මාසයේදීයි. ඒ HNB Finance ශාඛා ලැයිස්තුවේ 22 වන ශාඛාව විදිහට.

ඒ වගේමයි අපේ මධ්‍යස්ථාන පැතිරී ඇති ප්‍රදේශය ඉතා විශාලයි. සංඛ්‍යාත්මකව ගත්තොත් මධ්‍යස්ථාන 186 ක් වැලිමඩ ශාඛාව මඟින් මෙහෙයවනු ලබනවා. එම මධ්‍යස්ථාන හරහා අපේ ගනුදෙනුකරුවන්ට ව්‍යාපාර පවත්වාගෙන යාමට වගේම අළුතින් ව්‍යාපාර ආරම්භ කිරීමටත් අවශ්‍ය ණය පහසුකම් හා උපදෙස් ලබාදීමට අප සැදී පැහැදී සිටිනවා. අද වන විට අපගෙන් ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගෙන ඇති ගනුදෙනුකරුවන් සංඛ්‍යාව 3956කට අධිකයි. ඒ වගේම කුඩා හා මධ්‍යම පරිමාණ ණය, ලීසිං. රන්ණය, ඉතුරුම් වැනි අංශ ගණනාවකින් අපේ ගනුදෙනුකරුවන් සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවන්ට අනුව සේවාවන් ලබාදීමට අපි කැපවී සිටිනවා

අපේ මධ්‍යස්ථාන විසිරී ඇති ප්‍රදේශ ගත්තොත් වැලිමඩ ඉඳලා බණ්ඩාරවෙල ආසන්නය දක්වාත් අනිත් පැත්තෙන් බදුල්ල පාරේ ඇටැම්පිටිය දක්වාත් , නුවරඑලිය පාරේ හග්ගලට යනකනුත්, හපුතලේ පාරේ හල්දුම්මුල්ල  දක්වාත්, ඌව පරණගම ප්‍රදේශයෙන් මැදවෙල... උඩුපුස්සැල්ලාවට යනකනුත් අපේ මධ්‍යස්ථාන 186 ක් ස්ථාපිත කර තියෙනවා. මේ මධ්‍යස්ථාන හරහා එම ප්‍රදේශයන්හි ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරවල නිරතව සිටින අපේ ගනුදෙනුකරුවන්හට ණය මුදල් ලබා දීමට අපි කටයුතු කරනවා.

07 පිටුවට


ප්‍රදීප් නිශාන්ත පතිරණ
ශාඛා කළමනාකරු


දීපික රත්නායක
සහකාර කළමනාකරු


හර්ෂ චරිත්
පසුකාර්යාල ප්‍රධානී


දුමින්ද තනුජ ගුණරත්න
ක්ෂුද්‍රමූල්‍ය කළමනාකරු


උපාලි ජයවර්ධන
ක්ෂුද්‍රමූල්‍ය කළමනාකරු

## කෙටි කතාව

පහට එලාම් එක වදිද්දි තව ටිකක් නිදාගන්න හිත ඉල්ලන තරමටම ඇස්දෙක නිදිබර වෙලා... වෙනදට වඩා නින්දට යද්දි පැය දෙක තුනක් පරක්කු වෙලා... මගේ ඇස් ඉස්සරහ සැපට නිදාගෙන ඉන්න... රෝසපාට රෑ ඇඳුමට සුරංගනාවියක් වගේ පේන මගේ පුංචි සමනලී... දැක්කම නිදිමත ඇස්වලින් ඈතට ගියා... මොහොතක් ඒ පුංචි මූණ දිහා බලලා නොදැනෙන්න ඇඳෙන් බැහැලා ලා අඳුරෙම කාමරෙන් එළියට ආවා... කුස්සියෙ ලයිට් දාගෙන කමලම්මා දඩිබිඩියෙ වැඩ... කට්ලට් සුවඳ ගේ පුරාම විසිරිලා...

''කමලම්මා...''

''චූටි නෝනෙ...''

මගේ ජීවිතේ ගැන අකුරක් නෑර දැනගත්ත ඒ වියපත් දෑස ඇතුලෙ මං වෙනුවෙන් සෙනෙහසක් සැමදාම පෙනුණා...

''කමලම්මා කට්ලට් බදිනවාද?...'' තිබ්බනම් මම ඒ ටික කරනවානේ''

''ඕක මොකද්ද? මගේ නෝනේ... කේක් එක හැඩ වැඩ කරලා නිදා ගන්නකොට රෑ වුනානේ... ඉතින් නිදිමත නැතිවයැ...''

''ඉතින් කමලම්මත්... මා එක්ක නැගිටලා හිටියෙ.''

''මට... පාන්දර නැගිටලා හොඳට පුරුදුයි...චූටි නෝනා නින්දට ආසයි....මම දන්නවනේ...''

හීන් හිනාවක් මගේ මූණේ ඇඳුණා. ඔය කතාව ඔය විදිහටම කියපු තව කෙනෙක් මතක් වෙලා... ඒත් එක්කම පුංචි කඳුළක තෙතමනය මට දැනුණා...

''චූටි නෝනේ''' මේ...''

''ඇයි? කමලම්මේ...''

''මේ... එක්කො. චූටි බේබි මොන්ටිසෝරි ගිහින් ආවට පස්සෙ කතා කරමුකො... ඒ ගැන...''

''හ්ම්...''

කතාව මොකද්ද කියලා දන්න නිසාම උගුරෙන් වගේ ඒ හඬ පිටවුණා.

''අම්මී....''

පිටිපස්සෙන් ආපු කටහඬත් එක්කම මාව බදාගත්ත ''සමනලී'' හරි සතුටින් කෑ ගැහුවා...''

''ආ...මෙන්න...වෙනදට නැගිට්ටවන්න අමාරු එක්කෙනා අද එයාම නැගිටලා කමලම්මා...''

''හැපි බර්ත්ඩේ'' මගේ පුංචි සමනලී... ඒ රෝසපාට පුංචි කම්මුල් දෙක තදකරලා සිපගත්තෙ හරිම ආදරෙන්...

''තැන්කිවු අම්මා...'' හිස පැත්තට ඇල කරලා හරි හුරතලෙන් එහෙම කියනකොට කට දිහා බලන්න ආසයි.

''චූටි බේබිට...වාසනාවන්ත සුබ උපන් දිනයක්...වේවා'' කමලම්මත් ඊට නොදෙවෙනි සෙනෙහසින් සමනලීව තුරුලු කර ගත්තා...''

''තැන්කිවු ආච්චි අම්මා...''

ඒ ආමන්ත්‍රණයට හැමදාමත් වාගේ කමලම්මාගේ ඇස් දෙකේ කඳුලු පිරුණා. පස්සේ කටපුරා හිනාවුණා. ''සමනලී'' ආච්චි අම්මා කියනකොට කමලම්මගේ මූණෙ ඇඳෙන්නේමහා ලොකු ආඩම්බරයක්...

කොහොම වෙතත් මම වුණත් කමලම්මට සැලකුවේ මගේම අම්මට වගේ...

''එහෙනම් කමලම්මා...දෝණි වොෂ් දාලා ලැස්ති කරන්න...මම ඉතුරු වැඩ ටික කරන්නම්....''

''එහෙනම්...අපි යමු චූටි බේබි...නෝනේ මෙසේ උඩ ඔක්කොම කෑම ටික තියෙනවා. පාර්සල් හදන එක තමයි තියෙන්නේ...''

''තාච්චියෙ කට්ලට් ටිකට තෙල් ඉහින ගමන් මම ඔලුව වැනුවා...''

උදේ අට වෙද්දි සමනලී හැඩ වැඩ වෙලා ආඩම්බරෙන් එළියට ආවා...

''බලන්නකො කමලම්මා මෙයාගෙ ලස්සන...''

''ඒකනේ...පුංචි සුරංගනාවියක් වගේ...''

''මම සුරංගනාවියක් වගේ නම් තාත්ති බලන්න යන්න පුලුවන් නේද? අම්මී...ඔයා හැමදාම කියනවනෙ තාත්ති ඉන්නෙ සුරංගනා ලෝකෙ කියලා...''

හදවතට අකුණක් වැදුනා වගේ මට දැනුණා. කමලම්මා මගේ දිහා බැලුවෙ හරිම අසරණ දෑසින්...මගේ ඇස්වල කඳුලු නවත්තන්න පුලුවන් වුණත් කමලම්මා දන්නවා...අද දවසේ මගේ හිත පාරන මතකයන් එක්ක පිච්චෙනවා කියලා...

''හරි...හරි...අපි යමු දැන්...''

කාර් එක පාරට දාද්දි ඇහැට ආපු කඳුල හුළඟක් එක්කම වේලිලා ගියා...

''ගුඩ් මෝර්නිං මියැසි බබා... හරිම



# (අ)හිමි සෙනෙහස

ලස්සනයිනේ.. අපේ බර්ත්ඩේ ගර්ල්... හැපි බර්ත්ඩේ ඩාර්ලිං...''

නර්සරි එකේ ටීචර් ඇවිත් දේණිව වඩා ගත්තා... මියැසිට වගේම මටත් හිතවත් ටීචර් කෙනෙක්.

''බලන්නකො ටීච අද මෙයාට එනකල් ඉවසිල්ලක් නෑ...''

''ඒකනේ... ඉන්න මියැසිගේ අම්මා... බඩු ගොඩයිනෙ... මගේ මල්ලි කෙනෙක් ඇවිත් ඉන්නවා ඔයාට හෙල්ප් කරන්න එවන්නම්... හරි....''

''තෑන්ක්ස් ටීචර්...'' මම හෙමින් හෙමින් බඩු ටික එළියට ගත්තා.

''ඉන්න මම උදව් කරන්නම්....'' කන ළඟින් ඇහුන කටහඬත් එක්ක මාව ගැස්සිලා ගියා.

''තැන්ක්ස්... අනේ... පුලුවන්නම් මේ කේක් එක ගිහින් දෙනවද?''

''ඕ...කේ... මම ගෙනියන්නම්....''

දඟකාර හිනාවත් එක්කම කෙලින් බලන දෑස් මග ඇරලා මම බිම බලාගෙන කෑම පෙට්ටි ටික අතට ගත්තා...ඒ දෑස් වල හුරුපුරුදු බවක් මට දැනුනා.....

පාටි එක ඉවර වෙලා මම එළියට ඇවිත් බංකුවේ වාඩි වුණා... හිටගෙන ඉදලම කකුල් දෙකත් රිදෙන්න පටන් අරන් තිබුණේ...

''මොකෝ මහන්සිද...?''

ඒ දෑස් ආයෙමත් මගේ ඉස්සරහ...මම යාන්තමට හිනා වුණා...

ලේඛිකාවක නවකතා රචිකාවක ලෙස නිර්මාණකරණයේ යෙදෙන නදීකා ගීතාංජලී ප්‍රනාන්දු මහත්මිය සිය කුළුදුල් නවකතාව නෙතු කඳුළු ලියා පළ කලේ 2010 වසරේදීය. මේ වන විට සිය දෙවන නවකතාව රචනා කිරීමෙහි නියැලී සිටින ගීතාංජලි මෙහෙවර වෙනුවෙන් රචනා කරන දෙවන කෙටිකතාවයි මේ.



''ටිකක් විතර... වැඩ ඉවර නිසයි වාඩි වුණේ..''

''හ්ම්.... මේ බබා විතරද ඉන්නේ...''

බංකුවෙ එහා කෙලවරින් වාඩි වෙන ගමන් මගෙන් ඇහුවෙ හිනා වෙන ගමන්මයි...

''ඔව්... දුව විතරයි...''

''අද... දුවගෙ තාත්තිවත් එක්කගෙන එන්න එපැයි...''

මගෙ හදවත ආයෙමත් කඩන් වැටුණා වගේ දැනුණා. කියන්නෙ මොකද්ද? කියලා හිතාගන්න බැරි වුණා.

''එයා... එයා... ඉන්නෙ රට...''

කටට ආපු වචන එහෙම කියලා දැම්මට මම මටම දොස් කියා ගත්තා. ටීචර්ගෙ මල්ලි කෙනෙක් කියපු නිසා ටීචගෙන් මේ ගැන ඇහුවොත් මම බොරු කාරයෙක් වෙන හින්දමයි. ඒ... කියපු වචන ටික ඇදලා ගන්න බැරුව මම ලත වුණා...

''ආහ්.... ඒක තමයි... පුදුමයි හැබැයි...මෙච්චර ලස්සන වයිෆ් කෙනෙක් දාලා හස්බන්ඩ් රට ගිහින් ඉන්නවා බය නැතුව...''

''ඇයි? බය වෙන්නේ...''

මගේ හිතට පුංචි නොරිස්සුමක් නොදැනුනා නෙමෙයි...

''නෑ...නෑ... ඉතින් දුවෙක් ඉන්න අම්ම කෙනෙක් කියලා කියන්නවත් බැරි නිසා එහෙම කිව්වේ...ඇත්තටම ඔයා හරි ලස්සනයි...''

''එයාට මාව විශ්වාස නම්... මට එයාව විශ්වාස නම්...කොහේ හිටියත් ප්‍රශ්නයක් නැහැ.. මිස්ට.....''

''දහම්... දහම් සංධීප විජේනායක...මිස්ට කියල නම් කෑල්ලක් මගේ නමේ නෑ...''

ඒ කියපු විදිහට මට හිනාවක් ගියා.

''අම්මෝ... ඇති යාන්තමට හිනාවුනා... ඔයාගේ නමත් කියන්න කැමතිද?... මට...''

''මම... සදෙව්මි ගීත්මා...''

''ෂා... ඔයා වගේම නමත් ලස්සනයි''' ඔයා හැමදාම එනවද?''

''ඔව්... දුවව දාලා ගෙදර යනවා... ආයෙ ඇවිත් එක්කගෙන යනවා...''

''ජොබ් එකක් කරන්නෑ....''

''මම පොඩි බිස්නස් එකක් කරනවා...''

''හොඳයිනේ...''

''ඔයා ඇවිත් බබෙක්ගේ තාත්තා කෙනෙක් ද? නැත්නම් ටීචගේ වැඩකට ආවද?''

''බබෙක් නම් නෑ මොකද මම බැඳලා නෑනෙ. මම ආවෙ අක්කගෙ වැඩකට...''

''අනේ...සොරි...නර්සරි එක ඇරෙන්න ළඟයි...එහෙනම් මම යනවා.. උදව් කළාට ගොඩක් ස්තූතියි....''

''ඒක මොකද්ද?... අපි ආයෙ මුණ ගැහේවිනේ...''

ඒ කතාවට මම ඔලුව උස්සල බැලුවෙ අමුතු බවක් දැනුන නිසා...ඒ ඇස් දෙක මගේ ඇස්වල පැටළුන තත්පරයේම මම දැක්කේ ''අසෙනියගෙ ඇස් දෙක... ඒවා... ඒ වගේමයි...

''අසෙනිය'' මගේ ජීවිතේ මගේ කියන්න මට හිටපු එකම කෙනා... මගේ මුලු ජීවිතයම බාර දුන්නු කෙනා... මටත් වැඩිය විශ්වාස කරපු කෙනා... ගෙදර ආපු වෙලාවෙ ඉඳන්... මගේ හිත අසෙනිය ගැනම මතක් කරනවා... ඒ... අර ඇස් නිසාද... නෑ... අද සමනලීගේ උපන් දිනය... අද ඒ දවස මේ විදිහට ගෙවුනට... මීට අවුරුදු තුනකට කලින් මම හිටියෙ කරන්නෙ මොකද්ද? කියන්නෙ මොකද්ද? කියලා නොදන්න ලෝකෙම නැති වුන අවාසනාවන්ත ගැහැණියක් විදිහට... ඒ ගැන හරියටම දන්නෙ කමලම්මා විතරයි... එයත් එදා හිටියෙ ඒ විදිහට නිසා...

''චූටි නෝනේ...''

''කියන්න කමලම්මා...''

''නෝනේ... මේ... මේ... මම කියන්න ගියේ...''

''මම දන්නවා... කමලම්මෙ... දානෙ ගැන නේද? මට මතකයි...''

''මම මෙහෙම කියන එක හරිනෑ... තමයි චූටි නෝනේ... ඒත් අසරණ මං වෙන මොනා කරන්නද කාට කියන්නද?''

''මට.... ඉන්නෙත් කමලම්මා විතරමයි... ඉතින් මට නොකියා කොහොමද..''

''ඒ නෝනෙගේ තිබුණු ගුණයහපත්කමට...නැත්න ම් මිහිපිට ගෑණියෙක් කරන්න හිතනවත් දෙයක් නෙමෙයි මේ...''

''ඒක මගේ ලැබීම කමලම්මා...මම දුක් වුණා...ගොඩක්...සමනලී වෙනුවෙන් මම හිත හදා ගත්තා...කමලම්මා ඒක දන්නවා...''

''ඒත්... නෝනෙ දැන් වෙච්ච දේ වුණා.. නෝනෙ තාම ඉටි රූපයක් වගේ ලස්සනයි. මම නම් කියන්නේ තමන් ගැනත් පොඩ්ඩක් හිතුවනම් හොඳයි නේද?...''

10 පිටුවට



# HNB FINANCE
## වෙතින් කෝවිඩ් පාලනයට ත්‍රීරෝද රථ සඳහා
## "මගී ආරක්ෂණ ආවරණ"

**HNB FINANCE PLC** සමාජ සත්කාර වැඩසටහන් යටතේ කෝවිඩ් 19 වෛරසයේ ව්‍යාප්තිය පාලනය සඳහා පියවර ගනිමින් ත්‍රීරෝද රථ රියැදුරන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල, සහ මිරිහාන පොලීසියේ සහයද ඇතිව **HNB FINANCE** හි කළමනාකාර අධ්‍යක්ෂ ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතාගේ සහ බස්නාහිර පළාත භාර ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කපිල කටුපිටිය මහතාගේ ප්‍රධානත්වයෙන් නුගේගොඩ, මිරිහාන පොලිස් ක්‍රීඩා පිටියේදී සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට නුගේගොඩ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරී මාධව ගොඩගෙදර මහතාගෙන් ලැබුණු සහායද විශේෂයෙන් අගය කළ යුත්තකි.

කෝවිඩ් වසංගත තත්වය තුළ මගීන් ගෙන යෑමේදී සහ මගී සේවා පවත්වාගෙන යෑමේදී පිළිපැදිය යුතු සෞඛ්‍යය පිළිවෙත් පිළිබඳව ත්‍රීරෝද රථ රියැදුරන් දැනුවත් කිරීම මෙම වැඩසටහනේ මුඛ්‍ය අරමුණ විය. මෙම වැඩසටහන සඳහා නුගේගොඩ සහ ඒ අවට මගී සේවා පවත්වාගෙන යනු ලබන ත්‍රීරෝද රථ රියදුරන් 250ක් පමණ සහභාගී වූ අතර ඔවුන්ගේ ත්‍රීරෝද සඳහා ප්‍රමිතියානුකූල මගී ආරක්ෂණ ආවරණ සහ ත්‍රීරෝද රථ රියැදුරන් සඳහා ප්‍රමිතියානුකූල මුඛ ආවරණ ලබා දීමට ද **HNB FINANCE** සමාගම කටයුතු කරන ලදි.

මෙවන් දැනුවත් කිරීමේ සහ ත්‍රීවිල් රථ සඳහා මගී ආරක්ෂණ ආවරණ ලබාදීමේ වැඩසටහනක් සංවිධානය කිරීම සම්බන්ධයෙන් සහභාගී වූ ත්‍රීවිල් රථ රියැදුරන්ගේ නොමද පැසසුම් **HNB FINANCE PLC** වෙත හිමිවූ අතර මේ අවස්ථාවට මිරිහාන පොලිස් මූලස්ථානාධිපති - පොලිස් පරීක්ෂක එච්.ඊ.එම්.තුෂාර මහතා ඇතුළු පොලිස් කාර්යමණ්ඩලයේ නිළධාරීන් සහ **HNB FINANCE** සමාගමේ නිළධාරීහුද සහභාගී වූහ.■









05 පිටුවෙන්

ව්‍යාපාර කිරීම සඳහා මෙන්ම ඔවුන්ගේ අනෙකුත් මූල්‍යමය අවශ්‍යතා ඉටුකර දීමට අමතරව අපි අපේ පාරිභෝගිකයින් සඳහා හොඳ සේවාවක් ලබාදීමට නිරතුරුව කටයුතු කරනවා. නිදසුනක් විදිහට ගත්තොත් අපේ සාමාජිකාවන් සඳහා මෙහෙවර අරමුදල යටතේ ඔවුන් මුහුණ පෑ රෝගී තත්වයන්ට හා ව්‍යසනකාරී තත්වයන්ට මූල්‍යමය වශයෙන් ආධාර ලබාදීමට අපි කටයුතු කරලා තියෙනවා. ඒ වගේම සමාජ සුබ සාධන සේවා යටතේ ප්‍රදේශයේ වැඩිහිටි සහ ළමා නිවාස සඳහා විවිධාකාරයෙන් උදව් උපකාර කරනවා. ජනතාවත් සමග සමීපව කටයුතු කරන සමාගමක් වශයෙන් ඒක අපේ යුතුකමක් කියලයි මම හිතන්නේ.

මූල්‍ය ක්ෂේත්‍රය තුළ දිනෙන් දින සිදුවන වෙනස් කම් සැලකිල්ලට ගනිමින් වඩාත් විශ්වසනීයවූත් කාර්යක්ෂම සේවාවක් අප ගනුදෙනුකරුවන් වෙත ලබාදීමට නිරතුරුවම අප කටයුතු කරන බව මේ මොහොතේ අවධාරණයෙන් සඳහන් කළ යුතුයි.

අපගේ ව්‍යාපාරික ප්‍රජාවට වගේම අපගෙන් ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගන්නන්ටත් වඩාත් පහසු සහ සාධාරණ මූල්‍ය සේවා සැපයීම තුළින් අපගේ රට තුළ ආර්ථික සමෘද්ධියක් ඇතිකරලීමේ HNB Finance වෑයමට වාරුවක් වීමයි අපගේ ඒකායන බලාපොරොත්තුව.

දුරः- 0572117760
ඊ මේල් ඃ-
welimada@hnbfinance.lk



සටහන:-
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි

තමන්ටත් කුමක් හෝ දෙයක් ඉතා විශිෂ්ඨ ලෙස කළහැකි බව අමතක නොකරන්න.




**HNB FINNANCE හි පහළොස් වසක මෙහෙවර සැපිරූ වන් ඇගයුමට ලක්වූ මොහොත...**




NIGHT OF STAR 2020

HNB FINANCE

NIGHT OF STARS 2020

HNB FINANCE PLC හි කාර්ය මණ්ඩලයේ වසරක ප්‍රගතිය ඇගයුමට ලක්කරමින් වාර්ෂිකව පවත්වනු ලබන **Night of Stars** සම්මාන රාත්‍රිය පවතින කෝවිඩ් තත්වය හමුවේ පසුගිය වසරේදී පවත්වන්නට නොහැකි වූ අතර මාර්ගගත දෙමුහුන් තාක්ෂණය (Hybrid Online) ඔස්සේ ප්‍රධාන කාර්යාලය හා ශාඛාවන් සම්බන්ධකරමින් 2021 වසරේ පෙබරවාරි 12 දින පවත්වන ලද්දේ HNB FINANCE **Night of Stars** ඉතිහාසයට නවමු අත්දැකීමක් එක්කරලමිනි. පවත්වාගත යුතු සමාජ දුරස්ථභාවය ඵකගනිමින් සෞඛ්‍යය ආරක්ෂණ ක්‍රමවේදවලට අනුව යමින් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතාගේ ගෞරවනීය සහභාගීත්වයෙන් පවත්වන ලද **Night of Stars** උත්කර්ෂවත් සැදෑවට ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ශාඛාවන්හි සහ සේවා මධ්‍යස්ථානයන්හි සමස්ත කාර්යමණ්ඩලය මාර්ගගත දෙමුහුන් තාක්ෂණය ඔස්සේ සජීවි ලෙස සම්බන්ධ වූ අතර අදාල ජයග්‍රහකයන් සදහා තිළිණ ප්‍රදානය එම ශාඛාවන්හිදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් හා නිළධාරීන් අතින් සිදු කෙරිණි.




කළමනාකාර අධ්‍යක්ෂ
ප්‍රධාන විධායක නිළධාරී,
චමින්ද ප්‍රභාත් මහතා
උත්සව සභාව අමතමින්









හොදම අළෙවි
විධායක(ඉතුරුම්) -
ඞී. අනුජය ඉෂිර

හොදම අළෙවි විධායක
(ස්ථාවර තැන්පතු) -
භාතිය අමරසිංහ






පූරක කාර්ය
ඉටුකළ
අනුර

හොදම අළෙවි විධායක - (ඉතුරුම්) - බී. රාජීපන්

**කාර්යක්ෂමතාවය යනු ද වඩාත් හොඳ ක්‍රමය සොයාගැනීමයි.**



හොඳම ශාඛාව
අනු ශූරතාව - පදවියට



හොඳම සේවා මධ්‍යස්ථානය - මල්ලාවි




හොඳම අළෙවි විධායක - (කල්බදු) -
ප්‍රතාප් චමින්ද



වසරේ හොඳම විධායක නිළධාරි (නීති) සාරක මාඩිවල මහතා සම්මානයෙන් පිදුම් ලැබූ මොහොත




ජයග්‍රාහක ශාඛාවට
හිමි තිළිණ ප්‍රදානය



හොඳම ණය විධායක (ක්ෂුද්‍ර මූල්‍ය)
එස්.පවින්තරන්




පූරක කාර්ය
ඉටුකළ
ප්‍රියන්තිකානි



හොඳම ශාඛාව සහ ප්‍රාදේශිකය
ලෙස යාපනය අභිසෙස් ලබා...

ඔබ උපායශීලි නොවුවහොත් බොහෝ පාඩු සිදුවේ.

06 පිටුවෙන්

''කමලම්මා...කසාදයක් ගැනද කියන්නේ.....ජීවිතයම භාර දුන්නා මම අසේනියට...මටත් වැඩිය විශ්වාස කරා... අවුරුදු හයක් එකට ජීවත් වුණා...ඊට කලින් අවුරුදු දෙකක් එයාට ආදරේ කළා... කමලම්මා දන්නවා... මට අන්තිමට ලැබුණේ මොනවද සතුටු වෙන්න පුලුවන්.. මට නැතිවුණ ජීවිතේ සමනලීගේ ආදරෙන් ජීවත් කරගන්න පුලුවන් වුන එක විතරයි...ඒත්... අද දවස මගේ ජීවිතේ මටම එපා කරවපු දවසක්. ඒ දවසෙම ඉපදිච්ච පුංචි කෙල්ල වෙනුවෙන් මම හැම දුකක්ම යට කර ගත්තා... එයා ළඟ ඉන්නවා වගේ දැනෙනවා මට... කමලම්මා ඉන් එහාට මට කවුරුත් එපා... අපි තුන්දෙනා සතුටින් ඉමු...''

කමලම්මා මගේ ඔලුව අත ගාලා බර හුස්මක් හෙලුවා. ඇස් දෙකේ ගලන කඳුලු පිහදානකොට මම දැක්කා කමලම්මගේ ඇස්වල පිරිලා තියෙන කඳුලු.

''මම දානෙට ඕන හැම දෙයක්ම ලෑස්ති කරලා තියෙන්නේ කමලම්මා... ආරාමෙටම මෙදා පාරත් දානෙ දෙනවා.. අද සමනලි වෙනුවෙන් මේ දේවල් කරපු නිසා දානෙ හැමදාම වගේ හෙට දවල්ට පූජා කරනවා... අපිට ඒ වෙලාවට එතනට ගියාම ඇති...මම අට පිරිකරත් අර ගත්තා කමලම්මටම පූජා කරන්න පුලුවන්....''

''අනේ... නෝනට වැඩි වැඩියෙන් ලැබෙනවා...'' කඳුලු පිසිමින් යන වියපත් කමලම්මා දෙස මා බලා උන්නේ සොච්නි.

දානමය වැඩ කටයුතු ඉතා ඉහළ අන්දමින් සිදුවූයේ මාගේත් කමලම්මාගෙත් සිත් සනසවමිනි...ඒත්... මොකද්ද නොතේරෙන බරක් අපේ හිත්වල හැමදාම වගේ ඉතුරු වෙනවා.

''චූටි නෝනා... කෝල් එකක්...''

මහන්සියට නින්ද ගිය සමනලී ළඟට වෙලා.. නින්දත් නොනින්දත් අතර සිටි මට කමලම්මාගේ සද්දේ ඇහුණා.

''කවුද..? කමලම්මා....''

''චූටි බේබිගෙ ටීච...''

''ටීච....'' මට දැනුනේ කුතුහලයක්...

''හෙලෝ ටීච...''

''මියැසිගෙ අම්මා...මම මේ කතා කරේ ඔයාට පුංචි දෙයක් කියන්න...''

''ඔව්... ටීච... කියන්න''

''අනේ... මම ගැන වැරදියට හිතන්න එපා... එදා ඔයාට හෙල්ප් එකට එච්චේ මම බෝයි කෙනෙක්ව...''

''ඔව්..ටීච.. ටීචර්ගේ මල්ලි කෙනෙක් කිව්වේ...''

''ඔව් ..... මගේ මහත්තයාගේ මල්ලි.......එයා ඔයාගේ විස්තර මගෙන් ඇහැව්වා........ ඉතින් මම දන්න දෙවල් එයාට කිව්වා...... සොරි.... ඔයා එයාට කියලා තිබුනේ මහත්තයා රට කියලා...... නේද?''

'' ඔව්..... ටීච මට එකපාරටම එහෙම කියවුනා....''

'' මෙකයි කාරනේ මියැසිගේ අම්මා.... අපේ මල්ලි එන්ගේජ් වෙලා හිටියා එයාගේම නැන්දගේ දුව එක්ක... එත් එයා මල්ලිව රැවට්ටුවා..... වෙන සම්බන්ධයකින් දරුවෙක් ලැබෙන්න ඉදලා...... මල්ලි ඒක දැනගෙන පිස්සුවෙන් වගේ හිටියේ..... බොහෝම අමාරුවෙන් දැන් ඔය ඉන්න තත්වෙට ගත්තේ.....''

ටීච.... ඇයි? මට මේ විස්තර කියන්නේ......''

'' ඔයාව දැකලා මල්ලිට ලොකු කැමැත්තක් ඇතිවෙලා...... මම ඔයා ගැන දන්නවා.... ඒත්..... ඔයා මල්ලිත් එක්කත් කතාකරලම තීරණයක් ගන්න ඕන කියලා මට හිතුනා......''

'' ටීච..... මට ..... දුවෙක්......''

මට කියාගන්න ලැබුනේ එච්චරයි......

'' මම ඒක දන්නවා...... මල්ලිත් ඒක දන්නවානේ...... අපේ අකමැත්තක් නෑ.... හෙට උදේට මල්ලි එක්ක මම එන්නද ඔයාලාගේ ගෙදර......''

හරි..... ටීචර්..... එන්නකො.... මම එයාට කතා කරන්නම්.....

රිසිවරය තිබ්බ නෙමෙයි අත ඇරුන වගේ මට දැනුනා. මේ වෙන්න වන්නේ මොකක්ද? මට ඒ ඇස් දෙක අයෙම මැවිලා පෙනුනා.... ඒ...... අසෙනියගෙ ඇස් දෙකද....... නැ....... ඒ මට පේන විදිහ....... ඒ ඇස් දෙක මට අයිති නෑ.... මම හිතට කිව්වා..... කමලම්මාට විස්තරේ නොකියා බැරි වුනා. ඒත්... මගේ අම්මා නොවුනත් එයා ගොඩාක් සතුටු වුණා. ඒත්.... මගේ තීරණේ ඉස්සරහා එයා පුදුමයෙන් මා දිහා බලා ඉඳලා මගේ ඔළුව ඉඹලා යන්න ගියා......

''එන්න ටීචර් වාඩිවෙන්න......''

''දහම් .... වාඩිවෙන්න''

ආ... මෙයාගේ නමත් දන්නවා එහෙනම්....''

'' මගේ හිතට පුංචි ලැජ්ජාවක් දැනුනා....

''මම එදා කිව්වා... අක්කා....

මගේ අපහසුතාවය මඟහරින්න දහම් එහෙම කිව්වේ මා දිහා බලන ගමන්. ඒත්... මම එවෙලෙ අසෙනියගේ ඇස්දෙක ඒ ඇස් වල දැක්කේ නැ.....

''ඉතින් ටීචර් දැන් මොනවද? අපි කතාකරන්න ඕන කිව්වේ.....

මට නෙමෙයි.... මෙයාටයි කතා කරන්න ඕන ......

මම යන්තමට හිනාවුනා. ඒ අඩන්න බැරිකමට...

''අපි මොනවා හරි බීලා ඉමු. ටීච... කමලම්මා.....

ගෙදර වැඩට කෙනෙක් ඉන්නවද

''අනේ... නැ ටීචර් ඒ මගේ ළඟම නැයෙක් ම්... නැ... මගේම අම්මා කියලා හිතන්නකො.... සමනලිගේ අච්චි අම්මා.....

'' කමලම්මා මේසේ හරිනම් එන්න... ඔයාගේ සුරංගනාවිගේ ටීචර්ව පෙන්නන්න.....''

කමලම්මා ආවේ හරි ආඩම්බර හිනාවක් මුණෙ තියාගෙන..... ඒත් ටීචර්වයි, දහම්වයි දැකපු ගමන් ඒ මුණ පුදුමාකාර විදිහට වෙනස්වුණා..... ඇස් දෙකෙන් කඳුළු කඩාගෙන වැටුණා. දහම් වගේම ටීචර්ත් පුටුවෙන් නැගිට්ටා.

''නැන්දේ....'' දහම්ගේ හඬ ඇඩුම්බර



වුනා. මට මේ කිසිම දෙයක් තේරුම්ගන්න බැරිවුනා....

'' ඇයි ..... මේ..... කමලම්මා.... ඔයා මෙයාලව දන්නවාද? දහම්..... කියන්නකෝ......''

'' මේ..... මේ.... අපේ නැන්දානේ...... ඔයාව මම කොච්චර හෙව්වාද? අප්පච්චිගේ වදේට..... එයා මැරෙන්න කලින් ඔයාව බලන්න ඕන කියලා...... ඔයා කොහොමද මෙහෙට ආවේ..... සයුම්.... කොහේද?''

'' සයුම්.....'' ඒ නම ඇහෙනවත් එක්කම මාව තිගැස්සුනා. කමලම්මා දිහා බලන්න කලින් එයා මට කතා කලා.....

'' චූටි නෝනේ.... මේ මගේ අයියාගේ ලොකු පුතාගේ නෝනා..... මේ චූටි පුතා......''

'' කමලාම්මා මට නෑදැයෝ ඉන්න වගක් කිව්වේ නැහැනේ....''

'' එහෙම කිව්වානම් මට නෝනෙත් එක්ක මේ ගෙදර ඉන්න බැරි වෙනවානේ.....''

"මියැසිගේ අම්මා මම කිව්වේ ඔයාට...... මල්ලි එන්ගේජ් වෙලා හිටියේ මෙයාගේ දුව එක්ක....අර බැදුපු මිනිහෙක් එක්ක.....''

"දුව...... කමලම්මා කෑගැහැව්වා.....''

මාව හිටපු තැනම ඉන්දුනා...... කඳුළු කඩා හැලුනා..... කමලම්මා මාව බදාගෙන ඇඩුවා......

''එතකොට නැන්දා කෝ සයුම්...... ඇයි ? ඔයා මෙහේ ඉන්නේ......

කමලම්මා අසරණයි..... එයාගේ එකම පිහිට මම විතරයි....මගේ හිතට ලොකු ශක්තියක් දැනුනා....

'' වාඩිවෙන්න..... දහම්....., මම කියන්නම් ඇයි ඔයාලාගේ නැන්දා මෙහේ ඉන්නේ කියලා....''

'' නෝනේ....''

'' නෑ.... කමලම්මේ..... අපි ඇත්තට මුහුණ දෙන්න ඕන.....''

'' දහම්..... ඔයාගේ එන්ගේජ් වෙලා හිටිය සයුම්.... යාළුවෙලා තිබුනේ මගේ මහත්තයා අසෙනිය එක්ක......''

මගේ හඬ මොහොතකට බිඳුනා දහම් වගේම ටීචත් ඇස් ලොකු කරගෙන මංදිහා බලාගෙන හිටියා.

'' ඔයාගේ හස්බන්ඩ්.....''

'' ඔව්..... එයා මැරුණා.....''

'' එතකොට.... සයුම්.....''

''ඉන්න..... මම කියලා ඉවර නෑ.... මම මේ කිසිදෙයක් අවසාන මොහොත වෙනකම්ම දැනගෙන හිටියේ නෑ..... ඒ තරමට මම අසෙනිය විශ්වාස කළා. සයුම් ප්‍රෙග්නන්ට් වෙලා හිටියා කියලා ඔයා දන්නවානේ..... බබා ලැබෙන්න හොස්පිටල් ගෙනියද්දි තමයි දෙන්නම ඇක්සිඩන්ට් වෙලා තියෙන්නේ..... මට ආරංචිය ලැබුන ගමන් මම පිස්සියෙක් වගේ හොස්පිටල් දිව්වා..... මට මතකයි.... කමලම්මත් හිටියා..... හැමදේම දැනගන්න කොට සයුම් ජීවිතේ දාලා ගිහින් හැබැයි පුංචි එකාගේ ජිවිතේ බේරගන්න පුළුවන් වෙලා. කමලම්මා විලාප තියනවා මට ඇහුනා. අසෙනියට සිහිය ආවා.... මම එයා ලඟට ගියා.... ඇයි ? අහිංසක මට මේ වගේ දරුණු රැවටීමක් කළේ කියලා අහන්න...... ඒත්..... එහෙම දෙවල් අහන්න පුළුවන් තත්වෙක එයා හිටියේ නෑ.... මගේ අත්දෙකම අල්ලලා එයා ඇඩුවා..... මගෙන් එකම දෙයක් ඉල්ලලා එයා සයුම් එක්කම ගියා...... මං තනිවුණා.....

මගේ ඇස් වලින් එදා වගේම කදුළු කඩන් වැටුනා......

'' එතකොට බබා......''

'' පුතේ.... මේ ඉන්නේ දේවතාවියක්..... මගේ දරුවා කරපු දෙයින් පුතාගේ වගේම මේ දරුවගේ ජිවිතෙත් විනාශ වුණා...... ඒක එයාගේ ලැබීම...... ඒත් මෙච්චර හතුරුකමක් කරපු ගෑනිගේ දරුවට එයා අම්මා කෙනෙක් වුණා. හැමෝම අත්ඇරපු මාව එයාගේම අම්මා වගේ ලඟ තියාගෙන මගේ මිණිබිරිට ආච්චි අම්මා වෙන්න දුන්නා...... මෙහෙම අය කොහේවත් නෑ.....පුතේ.....''

කමලම්මා මාව බදාගෙන ඇඩුවා.....

'' ඒ කියන්නේ...... මියැසි සයුම්ගේ දුව......''

'' ඔව් දහම්.... දැන් මමයි එයාගේ අම්මා. සයුම් දරුවාව බිහි කළාට ඒ ඇගේ දුවන්නේ මගේ අසෙනියගේ ලේ..... ඒ මගේ නිත්‍යානුකූල සැමියා. ඒ නිසා එයාට අම්මාවෙන්න මට පුළුවන්...... මෙහෙම දෙයක් මම බලාපොරොත්තු වුනේ නෑ....... මම බලන් හිටියේ ඔයාට මගේ තීරණේ කියන්න''

''මගේ තීරණේ වෙනසක් නෑ..... සදෙවුම්.....''

'' මගේ තීරණේත් වෙනසක් නෑ දහම්....''

''ඒ කිව්වේ.....''

'' මගේ ආදරේ මැරුණා. දැන් මගේ ආදරේ මගේ පුංචි සමනලි..... ජීවිතේ තියනකන් කමලම්මයි, මායි, සමනළියි මේ විදිහට ජිවත් වෙනවා...... ඒක ස්ථිරයි. අසෙනියට ඇරෙන්න වෙන කාටවත් මගේ ජීවිතේට එන්න බැහැ දහම්..... මට සමාවෙන්න ටීච......''

''දහම්ගේ කාර් එක පිටවෙලා යද්දි..... සමනලි දුවගෙන ඇවිත් මාව බදාගත්තා.....

''අම්මි....'' ඇයි මගේ සමනලි....''මම පුංචි එකාව තදකරලා බදාගත්තා..... කමලම්මා අපි දිහා බලලා අර ආඩම්බර හිනාව මුණේ ඇඳගන්නවා මම දැක්කා. අසෙනිය ඉල්ලපු එකම ඉල්ලීම සැබෑ වුනා කියලා මට හිතුනා......

නිමි............




**Asia's Best Workplaces** - 2021
**TOP 40** | Sri Lanka

# HNB FINANCE PLC
## පස්වන වරටත් ශ්‍රී ලංකාවේ සේවය කිරීමට සුදුසු විශිෂ්ටතම සමාගම් අතරට

**HNB FINANCE PLC** අඛණ්ඩව පස්වන වරටත් ශ්‍රී ලංකාවේ සේවය සඳහා සුදුසු විශිෂ්ටතම ආයතන අතරට මේ වසරේදීත් එක් විය. එසේම ආසියාවේම සේවය සඳහා සුදුසු විශිෂ්ටතම විශාල පරිමාණයේ ආයතන කාණ්ඩය අතරට දෙවන වරටත් එක්වීම මෙන්ම Great Place to Work ජාත්‍යන්තර ආයතනය මගින් පළමු වරට මේ වසරේදී එක්කරන ලද "තරුණ සේවක සේවිකාවන් සඳහා මෙරට සේවය කිරීමට සුදුසුම ආයතන" 15 අතරට (15 best work places for millennials in Sri Lanka 2021) HNB FINANCE සමාගම නිර්දේශ වීමද විශේෂත්වයකි. මුළු මහත් සමාජයටම පෙර නොවූ විරූ අයුරින් අභියෝග එල්ල කළ ගෝලීය වසංගතයක් පවතින සමයකත් තම කටයුතු නොසැලී ඉදිරියට පවත්වාගෙන යන HNB FINANCE සිය සේවාවන් උසස් අන්දමින් පවත්වාගෙන යෑම සඳහා කැපවීමෙන් කටයුතු කරන සමාගමක් බව යළිත් තහවුරු කරඇත.

පසුගිය වසර මුලදී දිවයින පුරා ඇඳිරි නීතිය බලපැවැත්වීමත් සමඟම, සේවක අවශ්‍යතා සපුරාලීම සඳහා නම්‍යශීලී සේවා කාලසටහන් හඳුන්වාදීම මෙන්ම නිවසේ සිට වැඩ කිරීම වැනි නව්‍ය සේවක සුරක්ෂිතතාව මූලික කරගත් වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනික කටයුතු ශක්තිමත්ව හා අඛණ්ඩව පවත්වාගෙන යාමට HNB FINANCE කටයුතු කරන ලදි. දැඩි සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේද යටතේ ඉතාමත් සුලු සේවකයින් පිරිසක් අත්‍යවශ්‍ය වැඩ කටයුතු සඳහා වාර්තා කළේය. සියලුම සේවකයින්ගේ මානසික යහපැවැත්ම පවත්වා ගැනීම සඳහා සමාගම ඩිජිටල් තාක්ෂණය භාවිතා කළ අතර, කොරෝනා වෛරසයෙන් සෘජුවම බලපෑමට ලක්වූවන්ට ආධාර කරන ලදී. ආයතනික ක්‍රියාකාරිත්වය පහත යමින් තිබුනද, සේවක ප්‍රතිලාභ කිසිවක් කප්පාදු නොකිරීමට HNB FINANCE වග බලා ගත්තේය.

HNB FINANCE 2017 දී ප්‍රමුඛ සේවා යෝජකයෙකු ලෙස පිළිගැනීමට ලක් වූවා සේම 2017 දී හොඳම සේවා පරිශ්‍රය සඳහා වූ ලෝකඩ සම්මානය දිනාගත්තේය. 2018 දී මහාපරිමාණ ව්‍යවසායකත්වය සඳහා රිදී සම්මානය හිමිකර ගත් අතර 2017 දී එහි ශ්‍රම බලකාය උදෙසා වූ Pride and Advocacy විශේෂ සම්මානයෙන් පිදුම් ලැබීය. 2019 දී, ආසියාවේ සමාගම් අතරින් ඉහළම ස්ථාන 25 අතරට ඇතුළත් වූ ශ්‍රී ලාංකික එකම මූල්‍ය ආයතනය ලෙස HNB FINANCE සිය නාමය සනිටුහන් කරන ලදි. 2020 දී මහ පරිමාණ ව්‍යාපාර කාණ්ඩයේ සේවය කළ හැකි හොඳම සේවා ස්ථාන 40 අතරට පැමිණීමට සහ ලෝකඩ පදක්කම ද දිනාගැනීමට HNB FINANCE සමත් විය.■




# HNB FINANCE
## SLIM DIGIS සම්මානයෙන් පිදුම් ලබයි...!

**HNB FINANCE** සමාගමේ විශිෂ්ට සේවා තත්වය යළිත් ශක්තිමත් ලෙස සනිටුහන් කරමින් පසුගියදා නිමාවට පත්වූ SLIM DIGIS 2.0 හිදී ලෝකඩ සම්මානයක් හිමි කර ගැනීමට සමත් වුණා. HNB FINANCE ආයතනයේ අන්තර්ජාල සෙවුම් ප්‍රශස්තකරණය සහ අන්තර්ජාල සෙවුම් අලෙවිකරණය (Search Engine Optimization and Search Engine Marketing) යන ක්‍රියාවලීන් මෙහිදී ඇගයීමට ලක් වූ අතර විශේෂත්වය වන්නේ වාර්ෂික SLIM DIGIS සම්මාන උළෙලේදී ඇගයීමට ලක් වූ එකම මූල්‍ය සමාගම HNB FINANCE PLC පමණක් වීමයි.

HNB FINANCE විසින් ඉදිරිපත් කරනු ලැබූ "Building an organic footprint" යන උපායමාර්ගික ඩිජිටල් අලෙවිකරණ වැඩසටහන SLIM DIGIS සම්මාන උළෙලේදී මෙසේ සම්මානයට පාත්‍ර වූ අතර මෙම සම්මාන උළෙල සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වුණා.



''HNB FINANCE වෙබ් අඩවියෙහි අන්තර්ජාල සෙවුම් ප්‍රශස්තකරණය සහ අන්තර්ජාල සෙවුම් අලෙවිකරණය (Search Engine Optimization and Search Engine Marketing ) යන ක්‍රියාවලීන් SLIM DIGIS සම්මාන උළෙලේදී මෙසේ ඇගයීමට ලක් වීම අප ලද ගෞරවයක්. සමාගමක් සිය ඉලක්ක වෙත ගමන් කිරීමේ දී ඒ සඳහා විශාල ජවයක් ඩිජිටල් අලෙවිකරණය තුළින් ලබා දිය හැකියි. විශේෂයෙන්ම කෝවිඩ් වසංගතය හමුවේ සංචරණය සීමා වීම සමග ඩිජිටල් අලෙවිකරණය ඉතා ඵලදායී සහ නිර්මාණශීලී ලෙස අපගේ අලෙවි උපායමාර්ග ශක්තිමත් කිරීමට දායක වුවා. පාරිභෝගික අත්දැකීම සඳහා ඉහළ වටිනාකමක් ලබා දෙන ආයතනයක් ලෙස අපි හැමවිටම අපගේ සේවා කළඹ පිළිබඳව ඩිජිටල් මාධ්‍යයන් ඔස්සේ දැනුවත් කිරීම් සිදු කරනවා. ඩිජිටල් සේවා හැකියාවන් ප්‍රවර්ධනය සඳහා අප විසින් සිදු කළ ආයෝජනයෙහි ප්‍රතිලාභය මෙවැනි සම්මාන තුළින් නිසැකවම පිලිබිඹු වන බව මගේ අදහසයි'' යනුවෙන් HNB FINANCE PLC හි අලෙවි ප්‍රධානී උදාර ගුණසිංහ මහතා මෙහෙවරට පැවසුවේ අප ඒ පිළිබඳව ඔහුගෙන් කළ විමසීමකට පිළිතුරු වශයෙන්.■

# දිරියට සවියක්

සැබෑ වීර්යවන්තයින් සොයා..

වැලිමඩ නුවරඑළිය පාරේ කැප්පෙටිපොළදී පටු මාවතකට හැරෙන අපට ගවරන්මාන ගම්මානය හමුවෙයි. එළවළු හා මල් වගාව ප්‍රධාන ජීවනෝපාය කරගනිමින් ඊට මුල්තැනක් දෙන වැලිමඩ ජන ජීවිතය තුළ බොහෝ නිවෙස්හි සුළු වශයෙන් හෝ මේ කවර හෝ වගාවක් දැකිය හැකි වීම සුලභ ලක්ෂණයක්. විපුල කුමාර ගුණරත්න සහ නිලූෂි සමුද්‍රිකා යන දෙන්නා දෙමහල්ලන් විසින් එක්ව පවත්වාගෙන යනු ලබන සුජී පැල තවානට අප ගොඩවන්නේ මේ දිරිය අඹුසැමි යුවලගේ උත්සාහයෙන් හැඩගැන්වුණු කපුරුපැල තවාන් පසුපස වූ කතාන්දරය අසන්නටය. මේ නිලූෂිගේ හඩ

"පැල තවාන පටන් ගත්තේ මහත්තයා. අවුරුදු දහයක් වෙනවා මේ වෙද්දි ව්‍යාපාරය පටන් අරන්. එතකොට දිරිය ණය මුදලක් විදිහට රුපියල් 5000 තමයි මුලින්ම ගත්තෙ. ඉන් පස්සේ ආයතනයත් එක්ක විශ්වාසයෙන් ගනුදෙනු කරපු නිසා බොහෝම පහසුවෙන් අපට අවශ්‍ය ණය මුදල් අවශ්‍ය වෙලාවට ගන්න පුළුවන් වුණා. ක්‍රමයෙන් ලක්ෂයේ ණය මුදලෙ ඉඳලා ලක්ෂ තුනේ ණය මුදලත් අපි ගත්තා. ඒ බොරලන්දේ තව යාළුවෙක් එක්ක හවුලේ අළුතින් පටන් ගත්තු රෝස වගාවකට.

HNB Finance සමාගම දැන් අවුරුදු 10 විතර ඉඳන් අපේ මූල්‍ය සහකරුවා විදිහට කටයුතු කරනවා. මේ නිසා ව්‍යාපාර කටයුතු වලදි අනවශ්‍ය රස්තියාදුවීම් වලින් තොරව කිසියම් සැලසුමක් ඇතිව ව්‍යාපාර කටයුතුවල නියැලෙන්න පුළුවන්. ව්‍යාපාරය සඳහා ණය ගත්තා වගේම පහුගිය කාලේ HNB Finance සමාගමෙන් ත්‍රීවිලර් එකක් ගන්න ලීසිං පහසුකමකුත් ලබාගත්තා. වෙළෙන්දො අපි ළඟටම ඇවිත් මිළදී ගැනීම් කරන නිසා වෙළෙඳපොළ සොයා යාමේ ප්‍රශ්නයක් අපිට ඇති වෙන්නේ නෑ. ආදායම් තත්වය හොද නිසා බෙහොම ඉක්මනට තව ඉඩමක් අරන් මේ වගාව තව පුළුල් කරන්නයි හිතන් ඉන්නේ HNB Finance සමාගමත් එක්ක බැඳුණු මේ හිතවත්කම නිසා අපේ ජීවිත වලට ලැබුණේ විශාල ශක්තියක් බව නම් නොකියාම බැහැ.■



**HNB Finance නිසා අපේ ජීවිත වලට ලැබුණේ විශාල ශක්තියක් බව නම් නොකියාම බැහැ.**
-නිලූෂි සමුදිකා-

නිලූෂි සමුදිකා
ගවරන්මාන, කැප්පෙටිපොළ.



එල්.ටී.ජී. ඇන්තනී
සෙන්ට් ඇන්තනීස් වීල් එලයිමන්ට් සෙන්ටර්
මහවත්ත,නුගතලාව.

**ඉතිරි කරන ගමන් ව්‍යාපාරයට අවශ්‍ය මුදලුත් ලබාගත හැකිවීමේ වාසිය මම අත්විඳිනවා**
-එල්.ටී.ජී. ඇන්තනී-

ඔහු නමින් එල්.ටී.ජී. ඇන්තනී. ඇන්තනී වීල් එලයිමන්ට් ෂොප් එකක රැකියාවට බැඳුණේ මීට වසර ගණනාවකට ඉස්සර. ඒ තමයි ඔහුගේ පළමු රැකියාව. වසර කිහිපයක් එතැන රැකියාව කළ මේ තරුණයා ඉනික්බිත්තෙන් කොරියාවේ රැකියාවක් සඳහා පිටත් වෙන්නේ හැමදාමත් අනුන්ගේ යටතේ රැකියාවක් කිරීමෙන් තමන්ට වගතුවක් නොවන බව වටහා ගෙන. කොරියාවේ රැකියාව කිරීමෙන් අනතුරුව යළි ලංකාවට එන ඇන්තනී මෙතෙක් තමන්ගේ හිතේ සිහිනයක්ව තිබූ තමන්ගේම ව්‍යාපාරයක් පිළිබඳ අදහස යථාර්තයක් කරගන්න උත්සාහ කරන්නේ පුංචියට වීල් එලයිමන්ට් ෂොප් එකක් මහවත්ත ප්‍රදේශයේ ආරම්භ කරමින්. ඒ පිළිබඳව ඔහු අප සමග පැවසුවේ මෙවැන්නක් "මම ව්‍යාපාරය පටන් ගත්ත කාලෙම HNB Finance නිළධාරී මහත්තයෙක් මාව හමුවෙන්න ආවා. ඒ HNB Finance එකේ ඉතුරුම් ගිණුමක් විවෘත කරන්න. ඒ ඉතුරුම් ගිණුම හරහා මට ලැබෙන වාසි නිසාම එදා මම HNB Finance ඉතුරුම් ගිණුමක් විවෘත කළා. ගිණුමට සල්ලි දාන්න මට රස්තියාදු වෙන්න ඕන වුණේ නෑ. HNB Finance එකේ නිළධාරී මහත්තයෙක් දිනපතා හවසට මගේ ෂොප් එකට ඇවිත් තැන්පතු මුදල් ලබාගත්තා. දවසේ ආදායමින් ගානක් මම ඉතුරුම් සඳහා වෙන්කළ නිසා බොහොම ඉක්මණින් සැලකිය යුතු මුදලක් ඉතුරුකර ගන්න පුළුවන් වුණා. ස්වශක්ති ඉතුරුම හරහා ඇප රහිතව ණය මුදලක් ගතහැකි වීම නිසා මගේ ෂොප් එකේ කටයුතුවලට අවශ්‍ය ණය මුදල් ඉතා පහසුවෙන් අවශ්‍ය වෙලාවට ගන්න මට පුළුවන් වුණා.ඒ අනුව මුලින්ම ලක්ෂයේ ණය මුදලකුත් ඉන් පස්සේ ලක්ෂ හතරේ ණය මුදල් අවස්ථා තුනකදිත් ලබාගන්න බොහොම පහසුවෙන් මට පුළුවන් වුණා. ණය මුදල් ගෙවද්දිත් ආයතනයේ නිළධාරී මහත්තයෙක් ෂොප් එකටම ඇවිල්ලා එම ණය මුදල් ලබාගන්නා නිසා මගේ වැඩ පාඩුකර නොගෙන ඇගටත් නොදැනීම ඒ ණය වාරික ගෙවාදැමීමේ වාසිය මට ලැබෙනවා."■

මහනුවර හන්දෙස්ස කියන්නේ තවමත් ගැමි ජීවන රටාවට හුරු වෙච්ච සාම්ප්‍රදායික ජීවිත ගත කරන මිනිසුන් වාසය කරන ගමක්....එයිනුත් විවිධ පාරම්පරික වෘත්තීන් සිය ජීවන රටාව බවට පත්කරගත් උදවිය මේ ගමේ හිඟ නෑ .වසන්තා කුමාරි කියන්නෙත් එවන් පාරම්පරික වෘත්තියකට හිමිකම් කියන පවුලක සාමාජිකාවක්...ගෙදර මුළුතැන් ගෙයින් අද වන විට ක්‍රමයෙන් බැහැරට යමින් පවතින කුල්ල වසන්තාලා ගේ ජීවිතවලට අදටත් ආර්ථික වාරුවක් සපයන මෙවලමක් වෙලා.. මේ ඇය පවසන ඇගේ කතාව....

"මම විවාහ වෙලා මහත්තයාගේ ගමට පදිංචියට ඇවිල්ලා දැන් අවුරුදු 30කට කිට්ටුයි. මේ අය පාරම්පරිකව කුළු නිෂ්පාදනය කරන පවුලක්. බැඳලා ආවට පස්සෙ මමත් ඔවුන්ගේ වෘත්තියත් එක්ක එකතු වුනා..දැන් මගෙත් රස්සාව මේකම තමයි... කුළු නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ගේන්න අපිට ටිකක් දුර යන්න වෙනවා. විශේෂයෙන් උණ ලී වගේ දේවල්..ඒ සඳහා පෝමිට් ගන්න, වාහන කුලී ගෙවන්න, තව අත් උදව් කාරයින්ට දෙන්න යම් මූලික මුදලක් අවශ්‍ය වෙනවා..මෙහෙම කපල ගේන උණ ලී පලලා, පටි වලට ඉරලා අව්වේ දාලා වේලලා පදම් කරගන්න ඕන..ඒ මූලික කටයුතු වලින් පස්සෙ තමයි කුල්ල වියන්න පටන් ගන්නේ මේක වටේට ලී බඳින්න ගැනු අපිට බෑ ඒකට පිරිමි අය ඕනේ...මේ විදිහට සම්පූර්ණ කුල්ලක් හදලා ඉවර කරන්න දවස් තුන හතරක් යනවා..ඒ සම්පූර්ණ කාලය තුළ අපිට කුළු විස්සක් විසිපහක් වගේ හදන්න පුළුවන්...

කුළු නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගන්න, කුලී කාරයින්ට ගෙවන්න වගේ දේවල්වලට තමයි අපිට මුදල් අවශ්‍ය වෙන්නේ දැනට අවුරුදු දහයක විතර ඉඳන් අපේ නිෂ්පාදන අවශ්‍යතා සඳහා ණය මුදල් ගන්නේ HNB FINANCE සමාගමෙන්... අපේ අවශ්‍යතාවයට අනුව අපිට ගැලපෙන විදිහට කඩිනමින් අවශ්‍ය ණය මුදලක් ගන්න එදත් අදත් අපිට එක විදියටම පිහිට වෙන්නේ HNB FINANCE සමාගම ..ඒ ගන්න ණය මුදලින් හදන කුළු අලෙවි කිරීම සඳහා තරමක් දුර පළාත්වලට යන්න සිද්ද වෙනවා විශේෂයෙන් හිගුරක්ගොඩ, පොලොන්නරුව, අම්පාර, වගේ ඈත පැති වලට..මොකද කොළඹ වගේ නාගරික ප්‍රදේශවල අද කුල්ලට හිමි වෙලා තියෙන්නේ නරක කලදසාවක්. ඒත් අපි තවමත් මේ රැකියාවේ නිරත වෙලා ඉන්නවා.." වසන්තා පවසන පරිදි කුළු නිෂ්පාදනයට අද රට තුළ උද්ගතව තියෙන්නේ තරමක් අවිනිශ්චිත වෙළෙඳපොළ තත්ත්වයක්. එහෙත් ඔවුන් තවමත් සිය පාරම්පරික ජීවන වෘත්තිය අත හැරීමට සූදානම් නැහැ..තත්ත්වය එසේ වුවද මෙම වෘත්තිකයින්ගේ ජීවන තත්වය නගා සිටුවන්නටත් ඔවුන්ට සිය නිෂ්පාදන කරගෙන යාමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සහ දැනුම ලබා දීමටත් HNB FINANCE සමාගම අද වගේම හෙටත් ඔවුනට ශක්තියක්ම සපයනු ඇති.■



**කුළු නිෂ්පාදනය වගේ සාම්ප්‍රදායික වෘත්තීන් රැකිලා තියෙන්නේ HNB FINANCE සමාගම අපිට තවමත් උදව් කරන නිසා....**
-වසන්තා කුමාරි-

වසන්තා කුමාරි
හංදෙස්ස, මහනුවර.

ඔබ තනියෙන් සිතන්න පුරුදුවන්න. එවිට ඔබ ජීවත්වන බව දැනේ.

# ඔබ (NO)දන්න මම





**-කුෂාන්ත වීරසිංහ-**
නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකරු





- **සම්පූර්ණ නම :-** වීරසිංහ මුදියන්සේලාගේ කුෂාන්ත චමින්ද වීරසිංහ

- **උපන් දිනය (කැමති නම්) :-** 1984.06.02

- **ඔබේ ළමා කාලය සිහිපත් කළොත්:-** මගේ ගම වැලිමඩ, දඹවින්න. අපේ පවුලෙ අම්මයි තාත්තයි නංගියි මමයි. අම්මයි තාත්තයි දෙන්නා කළේ ගොවිතැන් වී ගොවිතැනත් හේන් ගොවිතැනත් කියන දෙකම කළා. ඉස්කෝලෙ යන අතරත් මම අපේ අම්මගෙයි තාත්තගෙයි ගොවිතැන් වලට උදව් වුණා. මම මුලින්ම පාසල් ගියේ වැලිමඩ ප්‍රාථමික විද්‍යාලයට දැන් ඒකෙ නම වැලිමඩ විජය විද්‍යාලය. ඒ දවස්වල 1 ඉදලා 5 ශ්‍රේණිය වෙනකම් විතරයි පන්ති තිබුණේ...දැන්නම් සාමාන්‍ය පෙළ වෙනතුරු ඒකේ පන්ති තියෙනවා මම පහේ ශිෂ්‍යත්වය පාස්වෙලා බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයට ඇතුලත් වීමට සුදුසුකම් ලැබුවා. ඒක තමයි ඌව පළාතේ ඒ කාලෙ තිබුණු හොඳම විද්‍යාලය. ඒක මිශ්‍ර පාසලක් ඒ විද්‍යාලයට යන එක අපිට ඒ කාලේ හීනයක් වෙලා තිබුණා. ගෙදර ඉදලා බණ්ඩාරවෙල ඉස්කෝලෙට කිලෝමීටර් විසි තුනක් දුරයි. අපි ඉස්කෝලේ ගියේ ස්කූල් බස් එකේ. අපේ පාසලේ විතරක් නෙමෙයි බණ්ඩාරවෙල වෙනත් පාසල්වල ළමයිනුත් ඒ බස් එකේ ගියා ඒ නිසාම ඒ ගමන හුඟක් විනෝදජනක ගමනක් වුණා. මේ නිසා වෙනත් පාසල්වල යාළුවන්ව හම්බවෙන්න අලුත් මිත්‍ර සම්බන්ධතා ඇති කර ගන්න ඒක හුඟක් ලොකු පිටුවහලක් වුණා . උසස් පෙළ දක්වා මම ඉගෙන ගත්තේ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ. උසස් පෙළට මම හැදෑරුවේ වානිජ විෂයන් . 2003 අවුරුද්දෙ මම උසස් පෙළ විභාගය ලිව්වා. ඒත් කැම්පස් යන්න ලකුණු මදි වුණා. දෙවෙනි පාරත් මම විභාගයට පෙනී සිටියා.

අම්මා තාත්තා අපි වෙනුවෙන් හුඟක් මහන්සි වුණා. මගේ ළමා කාලය ගෙවුනේ ඔවුන් අප වෙනුවෙන් විඳින දුක දකිමින් ..මමත් පාන්දර දෙකට තුනට නැගිටලා කුඹුරට වතුර දාන්න තාත්තත් එක්ක යනවා. මොකද දවල් වෙද්දි ඇලේ වතුර මදි කුඹුරට ගන්න තරම් ..පොඩි කාලේ ලැබු මේ අත්දැකීම් මගේ ජීවිතයට විශාල පන්නරයක් ලබා දුන්නා. රස්සාවක් කළා නම් ස්ථිර ආදායමක් ලැබෙනවා නේද කියන හැඟීම පොඩි කාලේ ඉඳලම මගේ හිතට දැනුනා. ගොවිතැන් කරනවා කියන්නේ ස්වීප් එකක් අරගෙන බලන් ඉන්නවා වගේ වැඩක් ..වගාවෙන් හොඳ ඵලදාවක් ලැබුණොත් ඉල්ලුම අඩු නිසා ලැබෙන ආදායම අඩුයි පලදාව අඩු වුනොත් ඉල්ලුමේ තරමට දීගන්න බැරි නිසා ඒත් ආදායම අඩුයි ...වගාවෙන් ලාභයක් ලැබෙන්නේ එහෙමත් කලාතුරකින්.

- **පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල :-** මම ගිය පාසල් අතරින් පොඩි ඉස්කෝලෙටත් මම කැමතියි. මොකද ජීවිතේට අත්තිවාරම වැටුණේ ඒකෙන් ..ඒත් ජීවිතේට හුගක් අත්දැකීම් ලැබුණේ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ දී ඒ නිසා මම ඒ විද්‍යාලයට හුඟක් කැමතියි.

- **විෂය :-** මම කැමතිම විෂය වාණිජ හා ගිණුම්කරණය. 9 වසරෙදි හඳුන්වලා දුන්නු ජීවන කුසලතා වලටත් මුල් කාලයේ මගේ වැඩි කැමැත්තක් තිබුණා...

- **ක්‍රීඩාව :-** පාසලේදී ක්‍රිකට් ගැහුවා කැඩෙට්න් කළා ..මීටර් 800, 1500 මැරතන් වගේ අංශවලට හිටියා. ෆුට්බෝල් වලින් පළාත් තරග වලට ගියා.

- **පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ :-** ලොකුවෙලා මෙහෙම කෙනෙක් වෙනවා කියලා අදහසක් මට තිබුණෙ නැහැ. ඒත් බැංකු ක්ෂේත්‍රය ගැන මගේ උනන්දුවක් තිබුණා. ඒ නිසයි උසස් පෙළට වාණිජ විෂයන් තෝරගන්න මම පෙළඹෙන්න ඇත්තෙ. පොඩි කාලේ ලබපු අත්දැකීම් නිසා මාසික පඩියක් ලැබෙන රැකියාවකට මම කැමැත්තෙන් හිටියා.

**යෙහෙළියක් දුන්නු අමුතු සබන් කෑල්ලක් ගාලා වෙච්ච් ඇබැද්දියක්...**

- **මුල්ම රැකියාව සහ වඩාත්ම ආශාවෙන් කළ රැකියාව :-** 2004දී උසස් පෙළ කරලා රස්සාවල් වලට Application දැම්මා උසස් පෙළින් පස්සේ කරන්නේ මොකක්ද කියලා හරි අවබෝධයක් මට තිබුණෙ නෑ, අනිත් අය කරන නිසා මමත් කළා . ලොකු තාත්තාගේ මාර්ගයෙන් නුවරඑළියේ සර්වෝදය Seeds Guarantee ලිමිටඩ් දැන් සර්වෝදය Finance ගිණුම් ලිපිකරු ඉල්ලුම්පත් දාලා ඉන්ටර්විව් තේරුණා. ඒකෙ මුල්ම පඩිය රුපියල් හාරදාහක්. රුපියල් තුන්දාහක් අතට ලැබුණා. ඔය 2004 අවුරුද්දෙදි. අවුරුද්දකට කිට්ටු කාලයක් මම එතැන වැඩ කළා. ඒත් මට ඒතැන ඇල්ලුවෙ නෑ. Account Clark වුණාට මට සිද්ධ වුණේ කඩේ යන්න බිල් කඩන්න වගේ වැඩ. ඔය අතරේ අපේ ගමේ බන්දුල අයියා හරහා තමයි මට ග්‍රාමීන් එක ගැන දැනගන්න ලැබුනේ. (ඔහු දැන් නුවරඑළිය ශාඛාවේ එකවුන්ට් එක්සෙකටිව් විදියට කටයුතු කරනවා.) ග්‍රාමීන් එකේ මධ්‍යස්ථාන අපේ ගමේ තිබුණා. ඒ නිසා ඒක ගැන අවබෝධයක් මටත් තිබුනා. මට ඉන්ටර්ව්‍යු යන්න තිබුණේ නුවර ශාඛාවට ඉන්ටව්ව් එකෙන් දහ දෙනෙක් තේරුණා.මට මුල්ම පත්වීම ලැබෙන්නේ දඹුල්ල ශාඛාවේ කෘෂිකාර්මික ණය අංශයේ ගිණුම් ලිපිකරු විදියට

- **මුල්ම රැකියාව සහ වඩාත්ම ආශාවෙන් කළ රැකියාව :-** 2004දී උසස් පෙළ කරලා රස්සාවල් වලට Application දැම්මා උසස් පෙළින් පස්සේ කරන්නේ මොකක්ද කියලා හරි අවබෝධයක් මට තිබුණෙ නෑ, අනිත් අය කරන නිසා මමත් කළා . ලොකු තාත්තාගේ මාර්ගයෙන් නුවරඑළියේ සර්වෝදය Seeds Guarantee ලිමිටඩ් දැන් සර්වෝදය finance ගිණුම් ලිපිකරු ඉල්ලුම්පත් දාලා ඉන්ටර්විව් තේරුණා. ඒකෙ මුල්ම පඩිය රුපියල් හාරදාහක්. රුපියල් තුන්දාහක් අතට ලැබුණා. ඔය 2004 අවුරුද්දෙදි. අවුරුද්දකට කිට්ටු කාලයක් මම එතැන වැඩ කළා. ඒත් මට ඒතැන ඇල්ලුවෙ නෑ. Account Clark වුණාට මට සිද්ධ වුණේ කඩේ යන්න බිල් කඩන්න වගේ වැඩ. ඔය අතරේ අපේ

14 පිටුවට

## සංජය සේනාසිංහ මහතා ශ්‍රී ලංකාවේ වරලත් වෘත්තීය කළමනාකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබයි.

HNB FINANCE PLC හි මානව සම්පත් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශයේ කළමනාකරුවෙකු ලෙස සේවයේ නියුතු සංජය සේනාසිංහ මහතා ශ්‍රී ලංකාවේ වරලත් වෘත්තීය කළමනාකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය දිනාගෙන ඇත. උක්ත ආයතනයේ හදාරණ ලද පුහුණු පාඨමාලාවෙන් පසු පවත්වන ලද මාර්ගගත පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයකින්ද අනතුරුව සංජය මහතාගේ වෘත්තීය පළපුරුද්ද සැළකිල්ලට ගනිමින් ඒ මහතාට ශ්‍රී ලංකාවේ වරලත් වෘත්තීය කළමනාකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය පිරිනමා ඇත.



13 පිටුවෙන්



ගමේ බන්දුල අයියා හරහා තමයි මට ග්‍රාමීන් එක ගැන දැනගන්න ලැබුනේ. (ඔහු දැන් නුවරඑළිය ශාඛාවේ එකවුන්ට් එක්සෙකටිව් විදියට කටයුතු කරනවා.) ග්‍රාමීන් එකේ මධ්‍යස්ථාන අපේ ගමේ තිබුණා. ඒ නිසා ඒක ගැන අවබෝධයක් මටත් තිබුනා. මට ඉන්ටර්විව් යන්න තිබුණේ නුවර ශාඛාවට ඉන්ටවිව් එකෙන් දහ දෙනෙක් තේරුණා.මට මුල්ම පත්වීම ලැබෙන්නේ දඹුල්ල ශාඛාවේ කෘෂිකාර්මික ණය අංශයේ ගිණුම් ලිපිකරු විදියට

- **ජීවිතේ අමතක නොවන සිද්ධිය ඃ-** 2007 අවුරුද්දේ මම නැවතිලා හිටියේ කුරුණෑගල බෝඩිමක, මගේ තවත් යාලුවෙක් එක්ක. ඒ බෝඩිමේ ඇන්ටිට දුවෙක් හිටියා. ඒ ළමයා Oriflame එකේ නියෝජිතයෙක් විදියටත් කටයුතු කළා ..දවසක් ඒ ළමයා Oriflame එකේ බඩු වගයක් ගෙනත් අපිටත් ගන්න කියලා දුන්නා ..ඒවා ගන්න අපේ අතේ සල්ලි තිබුණේ නෑ ..ඒත් කෙල්ලක් හින්ද නොගෙනත් බෑ..ඒකෙ අඩුවටම තිබුනේ සබන් ..අපි දෙන්නා සබන් කැට දෙකක් ගත්තා දැන් මේකත් ගාලා නානවා ..ඔය අතරේ දවසක් යාළුවා නිවාඩුවට ගෙදර ගියා ගිහින් දවසකට දෙකකට පස්සෙ මට කෝල් එකක් ආවා. අර සබන් ගාලා එයාගෙ ඇඟේ බිබිලි වගයක් ඇවිල්ලා ...ඒ කියලා දවසක් ගියේ නෑ මගේ ඇඟේත් බිබිලි දැම්මා අපි..කොම්පැණියටත් කතා කරලා සබන් ගැන කම්ප්ලේන් කරා ...ඒත් පස්සෙයි දන්නේ අපි දෙන්නට පැපොලයි හැදිලා තියෙන්නෙ කියලා ..ඒ වෙච්ච වස වැරැද්ද නම් ජීවිතේට අමතක වෙන්නෙ නෑ

- **ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනයඃ-** එහෙම විශේෂ දවසක් කියන්න නෑ. ජීවිතයෙ හැම දවසක්ම පුළුවන් තරම් සතුටින් ඉන්න තමයි උත්සාහ කරන්නේ මතක තියෙන සතුටු දවසක් විදියට මට මතක් වෙන්නේ 2005 ජුනි 22. ඒ ඉස්ඉස්සෙල්ලා ටයි එකක් දාලා රස්සාවකට ගිය දවස.මතක හිටින දුකක් මගේ ජීවිතේ තවම නෑ.

**අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා**

- **ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව ඃ-** මගේ පාසල් කාලයට මම හුඟක් කැමතියි ..ග්‍රාමීන් එකේ 2005 - 2009 අතර කාලය මම හිතන්නේ මම ජීවිතේට හුගාක් අත්දැකීම් එකතු කරගත්තු කාලයක් crisis කාලෙදී අපි ලබපු අත්දැකීම් අදත් අපේ ජීවිත ඉස්සරහට ගෙනියන්න උදව් කරනවා.

- **ජීවිතයට අභිමි වුණු වටිනාම පුද්ගලයා හෝ අවස්ථාව ඃ-** මගේ ලොකු තාත්තා. මීට අවුරුදු දෙකකට කලින් ඔහු නැතිවුණා. එයා තමයි මාව රස්සාවකට දැම්මෙ. ඔහු සමුපකාර පරීක්ෂකවරයෙක්. ඒත් ඔහුගෙන් අපි ලබා ගත්තු දේවල් බොහොමයි. එයා අදත් හිටියානම් අපේ ජීවිතවල වෙනස්කම් දැකලා හුඟාක් සතුටු වෙයි

- **හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතාවයක් ඃ-** මම කැපී පෙනෙන්න වැඩ කරන්න කැමැති කෙනෙක් නෙමෙයි. ඒ වගේ දේවල් වලට ඉදිරිපත් වෙනවත් අඩුයි. ඒ නිසාම මට ලැබෙන්න තිබුණු අවස්ථාත් මට නැති වෙන්න ඇති. මේ දුර්වලතාවය ටිකෙන් ටික අඩු කරගන්න උත්සාහ කරනවා.

- **ඔබ හිතන විදිහට ඔබ වඩාත්ම කුසලතාවන් ප්‍රකට කරන්නේඃ-** මට බොහොම ඉක්මනට පුද්ගලයන්ගේ හැකියාවන් හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවා. කණ්ඩායමක් අඳුනා ගන්න ඔවුන් එක්ක වැඩ කරන්න මට හැකියි. ඒ නිසා මම හිතනවා මම හොඳ කළමනාකරුවෙක් කියලා.

- **ඔබේ ජීවිතයේදී හමුවූ වඩාත්ම ආකර්ශනීය පුද්ගලයා, ඔහුතුළ ඔබ දකින සුවිශේෂීතාවය ඃ-** මම හැම පුද්ගලයෙක්ගෙන් ම වගේ ජීවිතයට ගන්න පුළුවන් දේවල් එකතු කරගන්නවා. තාත්තා අපිව හදන්න ජීවත්කරවන්න වෙච්ච මහන්සිය මට මතකයි ලැබුණු පුංචි ආදායම සකසුරුවම්ව වියදම් කරමින් කාටවත් ණය නොවී අපිව ලොකු මහත් කරන්න තාත්තා වින්ද දුක. ඔහු මගේ ජීවිතේ පරමාදර්ශී චරිතය කියලයි මට හිතෙන්නේ

- **පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම ඃ-** ඉස්කෝලේ 5 6 පන්තියේ ඉඳන්ම ආදර අත්දැකීම් තියෙනවා බලනවා කතා කරනවා ඒත් කවදාවත් ඒවා ඇගට ගත්තේ නැහැ රස්සාවල් කරන්න ආවට පස්සෙ තමයි ඒ ගැන හරියටම හිතන්න පටන් ගන්නේ මොණරාගල වැඩකරද්දි 2008 දි විතර මගේ ඥාතියෙක් මාර්ගයෙන් හඳුනා ගත් කෙනෙක් එක්ක ආදර සම්බන්ධයක් ගොඩනැඟුණා. ඒත් 2009 දි අපේ රස්සාවල් වලට ප්‍රශ්න කියලා දැනගත්තු ගමන් එයා මගෙන් අයින් වෙනවා. ඒ පලවෙනි ආදරය මට පාඩමක් කියා දීලා අයින් වුණා ඉන්පස්සෙ මගේ මුල් ආදරේට මට උදව් කරපු නෑනාම තමයි මට නිසංසලාව හඳුන්වලා දුන්නෙත්.

- **එම පුද්ගලයාගේ ඔබ දකින සුවිශේෂතාව ඃ-** ජීවිතේ බින්දුවටම වැටිලා තියෙන කාලෙ මට හම්බවුණු නිසංසලා සඳමාලි මාව තේරුම් අරන් මගේ ජීවිතේම කොටසක් වෙනවා. ඇය ගුරුවරියක් මාව තේරුම් අරන් මගේ රැකියාවේ තත්ත්වය තේරුම් අරන් ඇය කටයුතු කරනවා.

- **ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද ඃ-** ඇත්තෙන්ම, ජීවිතේ මුල ඉඳන් පටන්ගෙන මේ අද ඉන්න තැන දක්වා ගමන හුගක් වෙහෙසකරයි. ඒත් ඒ දුෂ්කරබව තුළම ආපහු හිතලා සතුටුවිය හැකි තෘප්තිමත් බවක් තියෙනවා.

- **ඔබේ ජීවිතය වෙනස් කළ හැරවුම් ලක්ෂ්‍යය (Terning Point)ඃ-** අපිට තිබුණු නැතිබැරිකම් එක්ක දෙවෙනි පාර උසස්පෙළ විභාගය කරන්න මට මගේ යාළුවෝ එක්ක කොළඹ ක්ලාස් යන්න පුළුවන්කමක් තිබුණේ නෑ.එහෙම නොගිහින් විභාගෙන් පස්සේ රැකියාවක් කරන්න මං ගත්තු තීරණය තමයි මගේ ජීවිතේ හැරවුම් ලක්ෂ්‍යය. මේ නිසා මගේ වෘත්තීය ජීවිතය ඉලක්ක කරගත්තු අධ්‍යාපනයක් එක්ක ජීවිතේ ඉදිරියට යන්න අවස්ථාවක් මට ලැබුණා.

- **ඔබේ ප්‍රියතම**

**ගායකයා ඃ-** සෝමතිලක ජයමහ

**ගීතය ඃ-** පොඩිපුතුගේ සිනාකටයි

**චිත්‍රපටිය ඃ-** විශේෂයෙන් කැමති චිත්‍රපටියක් නෑ

**කෘතිය ඃ-** පොත් කියවන්නෙ නම් අඩුවෙන්

- **අනාගත ඉලක්කය ඃ-** මගේ දරුවෝ දෙන්නට යහපත් ජීවිතයක් හදාදෙන එකයි. අසරණ වුණු නැතිබැරි මිනිස්සු වෙනුවෙන් අරමුදලක් ගොඩනගලා ඔවුන්ට යම් පිහිටක් වීමේ බලාපොරොත්තුවයි තමයි මගේ හිතේ තියෙන්නෙ.■

සටහනඃ- මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි

# සිත්තර යාළු

## පුංචි අපේ චිත්‍ර පිටුව

''සිත්තර යාළු'' චිත්‍ර පිටුව වෙන්වෙලා තියෙන්නේ එච් එන් බී ෆයිනැන්ස් කාර්ය මණ්ඩලයේ ඔබේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළි දැක්වීම පිණිසයි. "සිත්තර යාළු චිත්‍ර පිටුව ඔස්සේ ඔබගේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළිදක්වාලීමට ලැබෙන මේ මාහැඟි අවස්ථාව ප්‍රයෝජනයට ගෙන ඔබේ දරුවාගේ චිත්‍ර නිර්මාණ" **සංස්කාරක, චිත්‍ර පිටුව, මෙහෙවර** HNB **ෆයිනැන්ස් ගොඩනැගිල්ල, අංක 168, නාවල පාර , නුගේගොඩ. යන ලිපිනයට නොපමාව යොමු කරන්න.**



අපේ ගෙවත්ත
සෙනුමි යුතාරා-2 ශ්‍රේණිය



සමනල පැංචා
තරුලි ලියන්සා-5 ශ්‍රේණිය
(ලසන්ත සංජීව - ප්‍රධාන කාර්යාලය)



මල් වත්තක්
සිතාරා මෙත්සඳි තන්ත්‍රිගේ
හැපි කිඩ් පෙර පාසැල
(බුද්ධික තන්ත්‍රිගේ ප්‍රධාන කාර්යාලය)



යාළුවෝ
සයුරි අමාෂා දිව්‍යාංජලී-5 ශ්‍රේණිය
(නිශාන්ත ප්‍රදීප් කුමාර)



අපේ ගෙවත්ත
අනුකි ඔකිත්මා



උදෑසන අසිරිය
මලිති සඳුප්‍රභා තෙන්නකෝන්-2 ශ්‍රේණිය
(ටී.එම්. තිලකරත්න - නිකවැරටිය ශාඛාව)



වතුර බොන්න එන කොටියෙක්
එන්.පී. නෙතුම් භාෂිත පිලපිය-1 ශ්‍රේණිය
(උපාලි ජයවර්ධන - වැලිමඩ ශාඛාව)



බුදුහාමුදුරුවෝ
රනුග සුවහස් මෙන්ඩිස්-5 වසර
(සුනන්ද මෙන්ඩිස් - ප්‍රධාන කාර්යාලය)

### පසුලිය කලාපයේ ජයග්‍රාහකයෝ

- **කුරුළුලන්තේ**
  ශේෂාදි අනුත්තරා අබේසිංහ
  (ඒ එම් එල් බී අබේසිංහ - බදුල්ල ශාඛාව)
- **පූසී අම්මයි පැංචෝ රැනයි**
  පෙත්මී රනුල්යා මුදලිගේ - 2 ශ්‍රේණිය
  (ඉන්දික මුදලිගේ - හොරණ ශාඛාව)
- **වනන්තරේ සොබා සිරි**
  පී කේ නදුන් පෙරේරා - 5 ශ්‍රේණිය
  පී කේ අයි රොහාන් පෙරේරා - නාවලපිටිය ශාඛාව




# HNB FINANCE
## හැටන් ශාඛාව නව නිවහනකට ගෙවදුණු දා

වසර 20 ක් පුරා ලාංකීය පාරිභෝගික ජනතාව වෙත නම්‍යශීලී මූල්‍ය සේවාවන් තිළිණ කළ HNB FINANCE PLC හි හැටන් ශාඛාව පසුගියදා අංක 167, එම්.ආර්. ටවුන්, දික්ඔය පාර, යන ලිපිනයෙහි පිහිටි නව තෙමහල් ගොඩනැගිල්ලකට පිවිසියේය.

HNB FINANCE හි කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත් මහතා ගේ ප්‍රධානත්වයෙන් රටේ පවතින නිරෝධායන නීතිවලට අනුකූලව අභිනව හැටන් ශාඛාවේ සමාරම්භය සිදු කෙරිණ. මෙම අවස්ථාවට HNB Finance ප්‍රධාන කාර්යාලයේ සහ හැටන් ශාඛාවේ නිළධාරීහු සහභාගී වූහ.■






# HNB FINANCE
## මුලතිව් ශාඛාව රන් ණය සේවාව අරඹයි.



HNB FINANCE PLC හි රන් ණය සේවා තවදුරටත් ව්‍යාප්ත කරමින් සිය නවතම රන් ණය මධ්‍යස්ථානය අංක 94, පී.ඩබ්ලිව්.ඩී පාර මුලතිව් යන ලිපිනයෙහි පිහිටා ඇති HNB FINANCE මුලතිව් ශාඛා පරිශ්‍රයෙහිදී පසුගියදා විවෘත කරන ලදි.

මේ අනුව මුලතිව් නගර සීමාව හා ඒ අවට පාරිභෝගික ජනතාව වෙත මූල්‍ය සමාගමක් වෙතින් ලබාගත හැකි සියලු මූල්‍ය සේවා ලබාදෙන ප්‍රමුඛතම මූල්‍ය සමාගමක් බවට HNB FINANCE පත් වනු ඇත.

අභිනව HNB FINANCE මුලතිව් රන් ණය මධ්‍යස්ථානය HNB FINANCE හි ප්‍රාදේශීය කළමනාකාර ජෝෂප් ජෝන් සහ නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකාර එස්. මයුරන් යන මහත්වරුන් අතින් පසුගියදා විවෘත කෙරුණේ රජය මගින් ප්‍රකාශයට පත් කර ඇති කෝවිඩ් සෞඛ්‍යාරක්ෂිත විධිවිධානයන්ට අනුකූලවය.■

මෙහෙවර
H.N.B. FINNANCE PLC
නො :- 168 නාවල පාර
නුගේගොඩ
ටෙලි :- 0112176262
ෆැක්ස් : 0112825843
ඊ-මේල් :- manjula.p@hnbgrameen.lk

අධීක්ෂණය :-චමින්ද ප්‍රභාත්
කළමනාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
පිටු සැලසුම් :- කණිෂ්ක විජේතුංග
මුද්‍රණය :- අරජුන ග්‍රැෆික්ස්, රත්තනපිටිය.
ඡායාරූප ශිල්පී :- ලක්ෂමන් කුමාරතුංග